# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 80 — 1973 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා — 1973.10.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන් වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 969 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 977 |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 972 | අය-වැය ලේඛන ... ... ... | 978 |
| විභාග; විභාග, ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... ... | 982 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 976 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 982 |


**සැළකිය යුතුයි.**—රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 28 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන්—

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ කෙටදෙනියාව ගම් ප්‍රදේශයේ පිහිටි දැනට පවත්නා සමහර ඡන්ද කොට්ඨාශ ඒකාබද්ධ කිරීමට අදාලව 1964 ජූලි 10 වැනි දින අංක 14,102 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි වූ උපලේඛනය වෙනුවට මෙහි වූ උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි; තවද

(2) (1) වැනි ඡේදයේ සඳහන් විධිවිධාන—

(අ) එකී විධිවිධාන 1974 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහත කී කෙටදෙනියාව ගම් ප්‍රදේශයේ ගම් සභාවට සභිකයින් තෝරා පත් කර ගැනීමේ මහා ඡන්ද විමසීම සම්බන්ධ යම් කරුණකට අදාල වන තාක් දුරට, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට වලංගු විය යුතු යයිද,

(ආ) ඒවා වෙනත් යම් කරුණකට අදාල වන තාක් දුරට 1974 ජූලි මස පළමුවැනි දින සිට වලංගු විය යුතු යයිද, ප්‍රකාශ කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 18 දින,
කොළඹ දීය.

### උපලේඛනය

| I තීරය | II තීරය |
|---|---|
| පවත්නා ඡන්ද කොට්ඨාශ | නව ඡන්ද කොට්ඨාශ |
| 53 (ඒ)—පරගොඩ ... | ඡන්ද කොට්ඨාශ අංක 3—පරගොඩ, පරගොඩ සහ කරවිල කුඹුර යන ගම්වලින් සමන්විත වේ. ඡන්ද කොට්ඨාශ අංක 4—දියගම්පල.—දියගම්පල දිවුල්පෙතිය සහ කොරදමින්න යන ගම්වලින් සමන්විත වේ. |
| 52—හෙට්ටිමුල්ල ... | ඡන්ද කොට්ඨාශ අංක 6—හෙට්ටිමුල්ල—හල්ලොලුව, හෙට්ටිමුල්ල ලොලුව සහ යටිමිය යන ගම්වලින් සමන්විත වේ. ඡන්ද කොට්ඨාශ අංක 7—කැලෑගෙදර—කැලෑගෙදර, කුරබොටුවාව, පොත්තේගෙදර යන ගම්වලින් සහ නියබ්‍රෝම වත්තෙන් සමන්විත වේ. |
| 46—මඩිතියවල ... | ඡන්ද කොට්ඨාශ අංක 13—කලුඅග්ගල—ඉහළ කලුඅග්ගල සහ අංක 46, මඩතියවල ග්‍රාම සේවක කොට්ඨාශයේ පරණ හන්දිය නවාන පාරෙන් උතුරට පිහිටි මඩතියවල ගමේ කොටසින් සමන්විත වේ. ඡන්ද කොට්ඨාශ අංක 14—මඩිතියවල—කොටබෝල සහ අංක 46 මඩිතියවල ග්‍රාම සේවක කොට්ඨාශයේ පරණ හන්දිය නවාන පාරෙන් දකුණට පිහිටි මඩිතියවල කොටසින් සමන්විත වේ. |

---

**සන්නිපාත නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සන්නිපාත ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

| I වන තීරය<br>පවත්නා ඡන්ද කොට්ඨාශ | II තීරය<br>නව ඡන්ද කොට්ඨාශය |
|---|---|
| | ඡන්ද කොට්ඨාශ අංක 15—වත්තෙමුල්ල—වත්තෙමුල්ල, පහල කලුඅග්ගල සහ ගිනිදම්මන යන ගම්වලින් සමන්විත වේ. |
| 42—හල්පෙ ... | ඡන්ද කොට්ඨාශ අංක 16—හල්පෙ—හල්පෙ ගමින් සමන්විත වේ. |
| | ඡන්ද කොට්ඨාශ අංක 17—නරියාමුල්ල—නරියාමුල්ල, ගුරුල්ල ගම සහ වල්පොලමුල්ල යන ගම්වලින් සමන්විත වේ. |
| 43—කිතුල්වල ඉහළගම... | ඡන්ද කොට්ඨාශ අංක 18—කිතුල්වල ඉහලගම—කිතුල්වල ඉහළගම ගමෙන් සමන්විත වේ. |
| | ඡන්ද කොට්ඨාශ අංක 19—කිතුල්වල පහළගම—කිතුල්වල පහළගමින් සමන්විත වේ. |

10–207/1—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඕ.—බී. 27/39.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, 1972 ඔක්තෝබර් 09 වැනි දින අංක 28/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මොණරාගල දිස්ත්‍රික්කයේ සිත්තරම් පළාත ගම් ප්‍රදේශයේ දැනට පවත්නා එක් එක් ඡන්ද කොට්ඨාශය සහ එකී ඡන්ද කොට්ඨාශ ඇතුළත් ඒකාබද්ධ ප්‍රදේශය නව ඡන්ද කොට්ඨාශවලට අනුකොටස් කර බෙදීමට අදාළ නිවේදනය, එකී නිවේදනයේ ඇති උපලේඛනය වෙනුවට මෙහි ඇති උපලේඛනය ආදේශ කරමින් මේ නිවේදනය මගින් සංශෝධනය කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| I තීරය<br>දැනට පවතින ඡන්ද කොට්ඨාශ | II වන තීරය<br>නව ඡන්ද කොට්ඨාශ |
|---|---|
| අංක 147—සිත්තරම ... | අංක 1 දරන ඡන්ද කොට්ඨාශය—පැව්වැව, අලුත්ගොඩගම, සිත්තරමගම, ගල්වැව, සීනුක්කුවගම සහ බෙරලිය වැවගම නමැති ගම්වලින් සමන්විත වන සිත්තරම. |
| | අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—තණමල්විල නමැති ගමෙන් සමන්විත වන තණමල්විල. |
| | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය—කොමලිගම සහ බෝදාගම නමැති ගම්වලින් සමන්විත වන බෝදාගම. |
| | අංක 4 දරන ඡන්ද කොට්ඨාශය—පහළ සහ ඉහළ නිකවැව, මීගස්වැව සහ කුඩාවැව නමැති ගම්වලින් සමන්විත වන නිකවැව. |
| අංක 148—සූරියආර ... | අංක 5 දරන ඡන්ද කොට්ඨාශය—නියදගල, නිකාර, අඟුණකොලපැලැස්ස, ඇවරිය පැලැස්ස, සූරියආර, මහවැව ජනපදය යන ගම්වලින් හා කලවැල්ගල ජනපදයෙන් සමන්විත වන අඟුණකොල පැලැස්ස. |
| | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය—කලුවැල්ගල නමැති ගමෙන් සමන්විත වන කලුවැල්ගල. |
| අංක 149—හම්බෙගමුව සහ අංක 149 ඒ—උඩවලවේ ... | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය—හම්බෙගමුව සහ සීනුක්ගල නමැති ගම්වලින් සමන්විත වන හම්බෙගමුව. |
| | අංක 8 දරන ඡන්ද කොට්ඨාශය—අලුත්වැව සහ නැබොඩ නමැති ගම්වලින් සමන්විත වන අලුත්වැව. |
| | අංක 9 දරන ඡන්ද කොට්ඨාශය—කොටවෙරමන්කඩ දිවුලාන සහ කිලිම්බුන්න නමැති ගම්වලින් සමන්විත වන කිලිම්බුන්න. |
| | අංක 10 දරන ඡන්ද කොට්ඨාශය—කිරිඉබ්බන්ආර, මව්ආර සහ සමගිපුර නමැති ගම්වලින් සමන්විත වන කිරිඉබ්බන්ආර. |
| | අංක 11 දරන ඡන්ද කොට්ඨාශය—මහගම සහ දෙමෝදර නමැති ගම්වලින් සමන්විත වන මහගම. |
| | අංක 12 දරන ඡන්ද කොට්ඨාශය—බඟිරාව නමැති ගමෙන් සමන්විත වන බඟිරාව. |
| | අංක 13 දරන ඡන්ද කොට්ඨාශය—දිප්ජුලාන, කුරුගම්වැටිය සහ ඉකිරිය ජුලාන නමැති ගම්වලින් සමන්විත වන කුරුගම්වැටිය. |
| | අංක 14 දරන ඡන්ද කොට්ඨාශය—හබරලුවැව, කොවුල්ආර, කවුපිලගම, තන්කැටිය සහ උඩවලවේ නමැති ගම්වලින් සමන්විත වන හබරලුවැව. |

10–207/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, මෙම නිවේදනයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල සහ වැදිකුඹුර ගම් ප්‍රදේශයන්හි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නැවත බෙදීමට අදාලව 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන නිවේදනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරමි.

(1) (1) සහ (2) ඡේදයන්හි "බුත්තල" යන වචනය වෙනුවට "මොණරාගල" යන වචනය ආදේශ කිරීමෙන් ද;

(2) එහි වූ පළමුවැනි උපලේඛනයේ II වැනි තීරයේ අංක 10 දරන ඡන්ද කොට්ඨාශ විස්තරයෙහි "පාරවිල වත්ත" යන වචන වෙනුවට "පාරවිල වත්ත (කොටසක්)" යන වචන ආදේශ කිරීමෙන් ද;

(3) එහි වූ දෙවන උපලේඛනයේ II වැනි තීරයේ අංක 4 දරන ඡන්ද කොට්ඨාශ විස්තරයේ "ජිලෝන්වත්ත" යන වචන යට පසුවම "කුමාරදොල වත්ත" යන වචනය ඇතුළත් කිරීමෙන් ද;

(ආ) අංක 5 දරන ඡන්ද කොට්ඨාශ විස්තරයේ "අඹගොල්ගම" යන වචනය වෙනුවට "අඹගොල්ලගම" යන වචනය අදේශ කිරීමන් ද;

(ඇ) අංක 6 දරණ ඡන්ද කොට්ඨාශ විස්තරය වෙනුවට පහත සඳහන් විස්තරය ආදේශ කිරීමෙන් ද;

අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය—වැන්ගල්ලන්ද, වැන්ගල්ලන්ද ජනපදයෙන් සමන්විතය.

(4) 3 වැනි ඡේදයේ (අ) සහ (ආ) හි 1973 යන ඉලක්කම් වෙනුවට 1974 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද වේ.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දීය.

10–207/3—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, මෙම ආඥාවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැදි කුඹුර ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීමට අදාලව 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

(1) එහි (1) ඡේදයෙහි "බුත්තල" යන වචනය වෙනුවට "මොණරාගල" යන වචනය ආදේශ කිරීමෙන් ද; තවද

(2) එහි (2) ඡේදයෙහි "1973" යන ඉලක්කම් වෙනුවට "1974" ඉලක්කම් ආදේශ කිරීමෙන් ද වේ.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

10-207/4—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම, මෙම ආඥාවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ගම් ප්‍රදේශයේ සීමා වෙනස් කොට නැවත නිරූපනය කිරීමට අදාලව 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

(1) එහි "බුත්තල" යන වචනය වෙනුවට "මොණරාගල" යන වචනය ආදේශ කිරීමෙන් ද, තවද

(2) "1973" යන ඉලක්කම් වෙනුවට "1974" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද වේ.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

10-207/5—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින් එනම් කොළඹ දිස්ත්‍රික්කයේ මීරිගම සුළු නගර සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝග

ගෝ ඝාතක ආඥාපනත යටතේ ප්‍රකාශ කරන ලද පොදු ගෝ ඝාතක ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම්කිසි මහජන සෞඛ්‍ය පරීක්ෂකයකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝ ඝාතක ස්ථානය ඇතුළත මනා පරිපාලනය හා සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් ඒ නිලධාරියා විසින් වග කිව යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් ඒ සතා පරීක්ෂාකොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමතකර තිබේ නම් ද,

(ආ) යම් දිනක පූ. භා. 8 වත් දවල් 12 වත් අතර කාලයේදී ද මිස ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එසේ වුවද විශේෂ අවස්ථාවකදී මෙම නිශ්චිත වේලාවට වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපතිවරයා විසින් බලය දිය හැකිය.

(2) කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා, අනුමතකළ වේලාවේ සිට පැය 30 ක කාලයක් ගතවූවාට පසු යම් වේලාවක ද,

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්ෂාකොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසුයයි එම ඡේදය යටතේ අනුමතකර නොමැති නම් ද ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍යවූ සෑම විධිවිධානයක්ම යෙදිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සඳහා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාරය පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියහොත් 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකු විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝ ඝාතක ස්ථානයේදී මරණ ලද යම් සතෙකුගේ මස් හෝ අවමස් ආදිය 2 වැනි නියෝගයේ සඳහන් වූ යම් නිලධරයකුගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ මස් හෝ අවමස් ආදිය වහාම විනාශ කර දැමීමට සැළැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අවමස් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මනුෂ්‍ය ආහාර පිණිස ගැනීම වලකින අන්දමින් ඉවත්කරවීම කළ යුතුය.

7. මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසුයයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට ගෝ ඝාතක ස්ථානය භාරවූ නිලධාරියා විසින් අවසර නොදිය යුතුය.

8. (1) කිසිම තැනැත්තකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අවමස් ආදියක් 2 වැනි නියෝගයෙහි සඳහන්වූ යම් නිලධරයකුගේ නියමය යටතේ මිස ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) මනුෂ්‍ය ආහාරය පිණිස අදහස් කරන ලද මේ සතකුගේ කුණුපයේ ඉස්සරහ ගාත්වලත්, පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාරවූ නිලධරයා විසින් මී. සු. න. ස. යන සළකුණ හා අවස්ථාවෝචිත පරිදි 'ගවමස' හෝ 'එළුමස්' යන වචනය මුද්‍රා තබා තිබේ නම් මිස කිසිම තැනැත්තකු විසින් ඒ කුණුපය ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද සෑම සතකුගේම කුණුපය ඒ ස්ථානයෙන් ඉවත් කරනතුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. (1) මෙහි මින්මතු විධිවිධානය යොදා ඇති ආකාරයට යටත්ව ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව, ගාස්තුවක් අය කළ යුතුය.

| | රු. | ශත |
|---|---|---|
| හරකුන් සඳහා එකකුට ගාල්කිරීමේ ගාස්තුවද සමග ... | 2 | 0 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා එකකුට ගාල්කිරීමේ ගාස්තුවද සමග ... ... | 1 | 0 |

එසේ වුවද ගෝ ඝාතක ස්ථානයට ගෙන එන ලද සතකු මැරීම සඳහා නුසුදුසුයයි ප්‍රතික්ෂේප කරනු ලැබුවිට හෝ මැරීමෙන් ඉවත් කරනු ලැබුවිට ඒ සතා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තුව ශත 50 ක් පමණක් විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ ගාස්තුව එකී සතා සම්බන්ධයෙන් සභාවට ගෙවා එකී ගාස්තුව ගෙවූ බවට ලබා ගත් නිළ කුවිතාන්සිය ගෝ ඝාතක ස්ථානය භාරකරු වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු තැනැත්තා වශයෙන් සභාපතිවරයා විසින් ලියවිල්ලකින්

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුර භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදී ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදාල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නියත භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නියත භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අවම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පලාන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට කමන් සූදානමව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අත්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

**සැ. යු.**—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, කම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**————————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැදුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා : ————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඇ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :———.

(ii) දෙමළ :———.

(iii) ඉංග්‍රීසි :———.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :———,

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :———.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :———.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :———.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :———.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :———.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :———.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :———.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :———

(ආ) දෙමළ :———.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :———.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :———.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :———.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :———.

17. චරිත සහතික ලබාගත් අයගේ නාම සහ පදවි නාම :———.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මෙ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු කොළඹ නගර සභාවේ මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ. මේ සම්බන්ධව අංක 61 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ 1973.05.25 දින පල වූ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 14,400—3 × 480—3 × 600—රු. 17,640 වේ. විශ්‍රාම වැටුප් රහිත දීමනා ආණ්ඩුවේ ප්‍රමාණයන් අනුව ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(i) අයදුම්කරුවෝ ඇම්. බී. බී. ඇස්. (ලංකා) හෝ ලංකා වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි කරනු ලබන ඊට සමාන හෝ ඊට උසස් වෙනත් වෛද්‍ය සුදුසුකමකින් සමත්ව, පහත සඳහන් විභාගවලින් එකකින්වත් සමත්ව සිටිය යුත්තාහ :—

(ii) (අ) ඇම්. ඩී. (ලන්ඩන්) රාජ්‍ය වෛද්‍ය විද්‍යාවෙන් ;

(ආ) ඩී. පී. එච්. බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ ටොරොන්ටෝ විශ්ව විද්‍යාලයේ ;

(ඇ) ඇම්. පී. එච්. (හාවඩ්) හෝ සමාන සුදුසුකමක් ;

(ඈ) ඇම්. ආර්. සී. පී. (ලන්ඩන හෝ එඩින්බරෝ) ජන සෞඛ්‍ය ; හා

(ඉ) ඩී. ටී. පී. එච්. (ලන්ඩන්) ; හා

(iii) පරිපාලන හා ජන සෞඛ්‍ය වැඩ පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්ද.

4. තෝරාගනු ලබන අයදුම්කරුට කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලබන අතර, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත.

5. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.11.05 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා

කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 9 වන සහ 13 වන කොටුවල පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි:—

"9. ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබා ගත් දින වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව:—

13. පරිපාලනය සහ ජන සෞඛ්‍ය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර:—"

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 18 දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530—කොළඹ.

10–32—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මහජන සෞඛ්‍ය හෙදි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාරුකර යැවීමට හැකිය.

2. ඒකාබද්ධ වැටුප.—තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය: (1) වර්ෂයකට රු. 5,304 න් පටන් ගෙන, වර්ෂයකට රු. 144 බැගින් 9 වරක් වැඩිවී, රු. 6,600 දක්වා නගී. එහි රු. 5,736 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක. රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව, විවාහක දීමනාවන් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ. මේ වැටුප් ක්‍රමය පහත 3 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ඇති පුහුණු වූ පොදු සාත්තු සේවිකාවන් සඳහාය.

(2) වර්ෂයකට රු. 3,864—144 × 18—රු. 6,456 වැටුප් ක්‍රමය. එහි රු. 5,304 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව, විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ. මේ වැටුප් ක්‍රමය පහත (3) (අ) හා (ඇ) ඡේදවල සඳහන් සුදුසුකම් සහිත සේවිකාවන් සඳහා ය.

තෝරාගනු ලබන අපේක්ෂිකාවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔවුන්ට අදාල වැටුප් ක්‍රමයෙහි සුදුසු පියවරක පිහිටුවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්:

(අ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය, වින්නඹු සේවිකා සහතිකය සහ මහජන සෞඛ්‍ය හෙදි සහතිකය; හෝ

(ආ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය සහ වින්නඹු සේවිකා සහතිකය; හෝ

(ඇ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය. (සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.)

**සටහන:** වින්නඹු සේවිකා සහතිකය ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අපේක්ෂකයින්ට, පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩල මගින් නිල ඇඳුම් සපයනු ලැබේ. ඒ ප්‍රාදේශීය බලමණ්ඩලවල සීමාවන් ඇතුළත පදිංචි වන ලෙස ඔවුනට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර.—පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1973.11.06 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘතියෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය:—

**විශේෂ සුදුසුකම්:**

(1) සාත්තු සේවය පිළිබඳ ඇති සුදුසුකම්වල විස්තර;

(2) පුහුණු වූ මහජන සෞඛ්‍ය හෙදියක් ද යනු;

(3) වින්නඹු කර්මය පිළිබඳ පුහුණුව ලබා තිබේද යනු.

7. අයදුම්පතක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. අවශ්‍ය සාත්තු සේවිකා සහතිකවල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද නොමැතිව ලබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළ හොත් පමණි.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ,
ලේකම්.

1973 සැප්තැම්බර් 25 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

10–68—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වින්නඹු මාතා තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 2,640—16 × 60—රු. 3,600. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක නිලධාරීන්ට විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ. රජයේ සේවයේ විශ්‍රාම ගිය අයට ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 8 වැනි කොටස අනුව වැටුප් ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) හොඳ සනීපයෙන් සිටිය යුතු අතර, වයස් සීමාවක් නැත. අවුරුදු 50 ට වැඩි අය බඳවා ගනු ලැබුවහොත්, ඔවුන් තාවකාලික පදනමක් මත සේවයට බඳවා ගනු ලැබේ.

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් ලබාගත් ප්‍රවීණතා සහතික ඇති ලියාපදිංචිවූ වින්නඹු මාතාවක් විය යුතුය.

සැ. යු.—අවුරුදු 50 ට වැඩි අයෙක් ඉල්ලුම් කරන විට, 8 වැනි ඡේදයේ සඳහන් ස්ථාන අතුරෙන් යම් ස්ථානයක සේවයට කැමැත්තේ නම්, ඒ බව තමා එවන ඉල්ලුම්පතෙහි සඳහන් කළ යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1973.11.6 වැනි දින හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබෙන සේ එවිය යුතුය.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයෙහි හෝ පළාත් පාලනායතනවල සේවයෙහි යෙදී සිටින නිලධාරින්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. තෝරාගන්නා ලද අයදුම්කරුවන් මාරුකිරීමට යටත්වන අතර, පළමුවරට කල්පිටිය, වත්තල, කොළොන්නාව, පෑලියගොඩ, බේරුවල, හැටන්-දික්ඔය, තංගල්ල, කෝට්ටේ, බියගම යන ස්ථානවල ඇති පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ. තාවකාලික පදනමක් මත බඳවා ගන්නා, අවුරුදු 50 ට වැඩි අය මාරුකිරීමට යටත්වනු නොලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
**ලේකම්.**

1973 සැප්තැම්බර් මස 25 දින,
තැ. පෙ. 530,
කොළඹ.

10-67—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන සේවය**

**සහකාර හෙදි පාලිකා තනතුරු**

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 5,592—144×7—180×1—රු. 6,780. **එහි වර්ෂයකට** රු. 6,168 යන වටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත. මීට අමතරව රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක නිලධාරීන්ට විවාහක දීමනාවක් ද ගෙවනු ලබේ. තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් පියවරක තැබීම ගැන සලකා බලනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස : 1973.11.06 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි. පළාත් පාලන සේවයේ නොවන අයට උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.

(ආ) ඉල්ලුම්කරුවන්ට—

(1) පොදු සාත්තු සේවිකා සහතිකය තිබිය යුතුයි ;

(2) මහජන සෞඛ්‍ය හෙදි සහතිකය ; හෝ

කොළඹ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැන විසින් පවත්වනු ලබන දෙපාර්තමේන්තුමය විභාගය සමත් වීමෙන් පසු නිකුත් කරනු ලබන සහතිකය යන මින් එකක් තිබිය යුතුයි. මහජන සෞඛ්‍ය හෙදි සහතිකය ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

4. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් පළමුවරට කොළඹ මහ නගර සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පත්කරනු ලබන අතර, නගර සභාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.11. 06 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 9 වැනි කොටුව වෙනුවට, පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

" (අ) පුහුණු පොදු සෞඛ්‍ය සේවිකාවක් ද ? :—

(ආ) සාත්තු සේවය පිළිබඳ ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :— "

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා හෝ විසින් එම අයදුම්පත්, අවසාන දිනට ප්‍රථම ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් **පමණි.**

**එඩ්ගා ප්‍රනාන්දු,**
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 සැප්තැම්බර් මස 25 දින,
තැ. පෙ. 530, කොළඹ.

10-66—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 40/37.

**මහනුවර මහා නගර සභාව**

මහා නගර සභා ආඥපනත (252 වැනි අධිකාරය)

මහා නගර සභා ආඥපනතේ (252 වැනි අධිකාරය) 267 සහ 272 වැනි වගන්ති යටතේ මහනුවර මහා නගර සභාවේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිතව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, එකී ආඥපනතේ 268 වැනි වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාව.

**ඩී. රාජේන්ද්‍ර,**
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 9. 18 වැනි දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථාව**

කලින් කල සංශෝධිත 1907 ජනවාරි මස 11 වැනි දින අංක 6,165 දරන ගැසට් අතිරේකයෙහි පළ කැරුණු මහනුවර මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවල 107 වැනි අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයෙහි "1.25" යන ඉලක්කම වෙනුවට "2.00" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම අතුරු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙහි "0.60" යන ඉලක්කම් වෙනුවට "1.00" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්, හා ;

(3) එම අතුරු ව්‍යවස්ථාවෙහි (උ) ඡේදයෙහි "0.75" යන ඉලක්කම් වෙනුවට "1.00" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්.

10-9—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

### 1971 දෙසැම්බර් 31 දිනට බැරකම් හා වත්කම් ප්‍රකාශනය

| බැරකම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| තැන්පත් ... ... | | 1,19,869 17 |
| රජයේ ආධාර— | | |
| තානායම ... | 158 05 | |
| ක්‍රීඩාභූමි ... ... | 2,857 0 | |
| පුස්තකාල ... ... | 1,433 04 | |
| ප්‍රජා මණ්ඩල ... ... | 130 0 | |
| | | 4,578 09 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය ... | | 39,578 18 |
| | | 1,64,025 44 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... | | | 15,592 27 |
| ආයෝජන— | | | |
| ලංකා ඉතිරි කිරීමේ බැංකුව ... | | | 401 93 |
| මුදල් ශේෂය | | | |
| බැංකුවේ ඉතිරි ... | 26,488 67 | | |
| අත ඉතිරි ... | 6,141 11 | | |
| සුළු මුදල් ... | 250 0 | | |
| | | 32,879 78 | |
| ඌණතාවය | | | |
| 70.12.31 දිනට ඌණතාවය... | 1,05,587 22 | | |
| එකතු | | | |
| නිවාස යෝජනා ක්‍රමය සඳහා ඉඩම් ලබාගැනීමට ගෙවන ලද වියදමට බැරකළ යුතු මුදල වැරදි ලෙස අත්තිකාරම් ගිණුමට බැරකිරීම නිවැරදි කිරීම ... ... | 30,734 80 | | |
| | | 1,36,322 02 | |
| අඩු | | | |
| 1971 වර්ෂයේ අධිකය | | | |
| 1971 වර්ෂයේ ආදායම ... | 6,60,342 21 | | |
| 1971 වර්ෂයේ වියදම ... | 6,39,171 65 | | |
| | | 21,170 56 | |
| | | | 1,15,151 46 |
| | | | 1,64,025 44 |

ජාඇල නගරයේ විශේෂ කොමසාරිස්, ඩී. ඩී. එච්. සූරියආරච්චි වන මම, මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට ඉහත සඳහන්ව ඇති 1971.12.31 වැනි දිනට ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සැබෑ හා නිවැරදි බවට සහතික කරමි.

ඩී. ඩී. එච්. සූරියආරච්චි,
විශේෂ කොමසාරිස්, ජාඇල නගරය.

1972 ජූලි මස 22 දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඒ. සිරිල් සිල්වා,
සමාදාන විනිශ්වයකාර තැන.

1972.7.22 දින,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

## ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

### 1971 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය

| අදායම | රු. ශ. | වියදම | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... ... | 2,32,219 89 | ඒ.—සාමාන්‍ය වියදම ... ... | 96,592 61 |
| බී.—මහා මාර්ග ... ... ... | — | බී.—මහා මාර්ග ... ... ... | 68,680 76 |
| සී.—තානායම් සහ අම්බලම් ... | 9,226 51 | සී.—තානායම් සහ අම්බලම් ... ... | 7,770 25 |
| ඩී.—නගර සහා ඉඩම් සහ ගොඩනැගිලි ... | 10,503 20 | ඩී.—නගර සහා ඉඩම් සහ ගොඩනැගිලි ... ... | 9,816 79 |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 85,394 93 | ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 1,63,388 63 |
| ඇප්.—මහජන විනෝදය ... ... | 23,061 20 | ඇප්.—මහජන විනෝදය ... ... | 270 0 |
| ජී.—සුසාන භූමි ... ... ... | 60 0 | ජී.—සුසාන භූමි ... ... | — |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | 17 0 | එච්.—බල්ලන් විනාශ කිරීම ... ... | 63 0 |
| ජේ.—විදුලිබල කාර්‍යාංශය ... ... | 2,99,098 73 | ජේ.;—විදුලිබලය සඳහා ... ... ... | 2,84,712 71 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | 760 75 | ඇම්.—කියවීම ශාලා සහ පුස්තකාල ... ... | 7,876 90 |
| මුළු එකතුව... | 6,60,342 21 | මුළු එකතුව ... | 6,39,171 65 |
| වෙනත් ලැබීම් | | වෙනත් ගෙවීම් | |
| තැන්පත් ... ... ... | 61,141 96 | තැන්පත් ... ... ... | 54,688 77 |
| අත්තිකාරම් ... ... ... | 26,089 87 | අත්තිකාරම් ... ... ... | 28,454 69 |
| තානායම් සඳහා රජයේ ආධාර ... ... | 6,235 0 | තානායම් සඳහා රජයේ ආධාර ... ... | 6,076 95 |
| ප්‍රජාමණ්ඩල සඳහා රජයේ ආධාර ... | 130 0 | ලංකා සේවිංස් බැංකුවේ ආරක්ෂිත ගණනාය ... | 151 93 |
| ලැබීම් එකතුව ... | 7,53,939 04 | ගෙවීම් එකතුව ... | 7,28,543 99 |
| 1970.12.31 දිනට ඉතිරි ... ... | 7,484 73 | 1971.12.31 දිනට ඉතිරි ... ... | 32,879 78 |
| | 7,61,423 77 | | 7,61,423 77 |

ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් දොන් ඩයනිසියස් හේමචන්ද්‍ර සූරියආරච්චි වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නගර සභා ආඥපනතේ (පරිච්ඡේදය 255) ප්‍රකාර 1971 වර්ෂයේ ජාඇල නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳ නිවැරදි වූත්, සත්‍ය වූත් වාර්තාවක් බවට ඉහත සඳහන් ප්‍රකාශය මෙයින් සහතික කරමි.

ඩී. ඩී. එච්. සූරියආරච්චි,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස්.

1972 ජූලි මස 22 දින මා ඉදිරිපිට, ජාඇල දී සහතික කරන ලදී.

ඒ. සිරිල් සිල්වා,
සමාදාන විනිශ්චයකාර තැන.

1972 ජූලි මස 22 දින,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–105—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## රාගම සුළු නගර සභාව

### 1973 වර්ෂයේ පලමුවැනි පරිපූරක අය වැය ලේඛනය

පළමුවැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂ සහ උප ශීර්ෂ | විස්තරය | මුදල රු. ශ. | යෝජනා ස්ථිරත්වය |
|---|---|---|---|
| ඩී.—(7) බී නඩත්තු කිරීම | ... ... ... | 500 0 | 1973.5.31 වැනි දින අංක 7(1) දරණ යෝජනාව |
| ඊ.—(4) ඉඩම් සතුකර ගැනීම | ... ... .... | 13,000 0 | .... 1973.6.29 වැනි දින අංක 6(2) දරණ යෝජනාව |
| | | 13,500 0 | |

1973.05.31 වැනි දින අංක 7(1) සහ 1973.06.29 වැනි දින අංක 6(2) දරණ යෝජනාව අනුව ඉහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමතියට යටත්ව සභාසම්මත විය.

ඇස්. ජේ. ඇන්. ඇන්. පී. අමරසේකර,
සභාපති,
රාගම සුළු නගර සභාව.

1973.7.18 වැනි දින,
රාගම සුළු නගර සභා කායර්‍යාලයේ දිය.

සංශෝධිත පරිදි අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස්.
(කො.දි.)

1973.9.10.
බම්බලපිටියේදිය.

10–8—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## බලපිටිය සුළු නගර සභාව

### 1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අය වැය ලේඛනය

1 වැනි කොටස—සාමාන්‍ය අංශය

| වැය ශීර්ෂ | | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | | |
| 1. සේවකයින්ගේ වැටුප් : | | |
| (බී) ලිපිකරුවන් ... | ... ... | 4,682 64 |
| (එෆ්) විශාම වැටුප් ... | ... ... | 1,500 0 |
| 2. කාර්ය මණ්ඩලයේ වියදම් : | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණය, ප්‍රසිද්ධ කිරීම් | ... | 2,500 0 |
| (එම්) අතිකාල දීමනා | ... ... | 300 0 |
| සී.—නගරසභා ඉඩම් හා ගොඩනැගිලි— | | |
| 7. අළුත් වැඩ ... | ... | 3,600 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය— | | |
| 2. කසල ශෝධනය : | | |
| (බී) කරත්ත ගොනුන් හා ලොරි ... | ... | 150 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම : | | |
| (ඒ) ඉදිකිරීම ... | ... ... | 375 0 |
| 6. ආරෝග්‍ය ශාලා : | | |
| (ඒ) වැටුප් ... | ... ... | 300 0 |
| (ඕ) විවාහ දීමනා ... | ... ... | 30 0 |
| | එකතුව ... | 13,437 64 |

2 වන කොටස—විදුලිය අංශය

1. තොග වශයෙන් මිළයට ගැනීම :

| | | රු. ශ. |
|---|---|---|
| (ඒ) විදුලිය ගාස්තු ... | ... ... | 6,500 0 |
| 3. පාලන හා සාමාන්‍ය වියදම් : | | |
| (ජේ) ලිපි ද්‍රව්‍ය .... | ... ... | 500 0 |
| | එකතුව ... | 7,000 0 |

ඉහත සඳහන් පරිපූරක අයවැය ලේඛනය 1973 සැප්තැම්බර් මස 03 වැනි දින රැස්වීමේ දී අංක 11 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 03 වැනි දින,
බලපිටිය,
සුළු නගරසභා කාර්යාලයේ දී ය.

10–139—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

## පොල්ගහවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසිවල අංක 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය—අයවැය ලේඛනය—1973

1973 අය වැය ලේඛනයේ මුදල් ඉතිරිවේයැයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවායයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ට මෙහි පහත සඳහන් පරිදි මාරු කිරීම 1973.04.11 සහ 1973.08.30 දිනවල පැවැත්වූ පොල්ගහවෙල සුළු නගර සභාවේ රැස්වීම්වලදී පිළිවෙලින් අංක 1 සහ 3 දරණ යෝජනා වලින් සම්මත කර ගන්නා ලදී.

### I කොටස—සාමාන්‍ය

| මුදල් ඉතිරිවේයැයි ගණන් බලන වැය ශීර්ෂ හා මුදල් | රු. | ශ. | මුදල් අවශ්‍යවී ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—(2) (ඒ) අතිරේක දීමනා ... ... | 350 | 0 | ඒ.—(1) (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 1,800 | 0 |
| ඒ.—(2) (ඩී) අයබදු තක්සේරුකරු ගාස්තු ... | 2,150 | 0 | ඒ.—(1) (ඩී) කාර්යාල සේවකයින් ... ... | 100 | 0 |
| ඒ.—(5) පාසල් පොත් බෙදාදීමේ වියදම් ... | 375 | 0 | ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 2,850 | 0 |
| බී.—(2) නඩත්තු කිරීම් ... ... | 2,500 | 0 | ඒ.—(1) (එච්) විවාහක දීමනා ... ... | 325 | 0 |
| බී.—(7) අත්පත්කර ගැනීම ... ... | 1,000 | 0 | ඒ.—(2) (සී) අයබදු අයකරන්නන්ගේ කොමිස් ... | 800 | 0 |
| බී.—(8) දියුණු කිරීම ... ... ... | 2,500 | 0 | ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් සහ මුද්දර ... | 750 | 0 |
| සී.—(7) අළුත් කර්මාන්ත ... ... | 2,000 | 0 | ඒ.—(2) (අයි) දුම්රිය නිවාඩු බලපත්‍ර ගාස්තු ... | 750 | 0 |
| ඩී.—(1) (එච්) කාණු තැනීම ... ... | 2,250 | 0 | ඒ.—(4) ආධාර දීමනා ... ... ... | 1,750 | 0 |
| ඩී.—(7) (ඒ) වේතන ... ... ... | 750 | 0 | බී.—(4) වීථි ආලෝක කිරීම ... ... | 2,500 | 0 |
| ජේ.—(7) ඉදිකිරීම් ... ... ... | 2,000 | 0 | ඩී.—(2) (බී) කරත්ත ගොන් සහ ලොරි ... ... | 2,000 | 0 |
| | | | ඩී.—(3) (බී) කරත්ත ගොන් සහ ලොරි ... | 2,000 | 0 |
| | | | එෆ්.—(2) නඩත්තු ... ... ... | 250 | 0 |
| එකතුව ... | 15,875 | 0 | එකතුව ... | 15,875 | 0 |

### II කොටස—විදුලිය අංශය

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 3. (ජේ) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ගාස්තු, ප්‍රචාරණ වියදම් සහ කාර්යාලීය වෙනත් වියදම් ... ... | 500 | 0 | 3. (ඒ) වැටුප් සහ වේතන ... ... | 625 | 0 |
| 3. (එල්) නීතිඥ ගාස්තු ... ... | 150 | 0 | 3. (බී) විවාහ දීමනා ... ... ... | 175 | 0 |
| 3. (කිව්) විවිධ වියදම් ... ... ... | 500 | 0 | 3 (එච්) විශ්‍රාම වැටුප්—පාරිතෝෂික මුදල්, අර්ථ සාධක අරමුදල්වලට දායක මුදල් ... ... | 500 | 0 |
| 4. (බී) විවාහ දීමනා ... ... ... | 150 | 0 | | | |
| එකතුව ... | 1,300 | 0 | එකතුව ... | 1,300 | 0 |

ඩබ්ලිව්. ගාමිණී ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

1973 සැප්තැම්බර් මස
පොල්ගහවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10–16—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### 1973 වර්ෂයේ 5 වන පරිපූරක අයවැය ලේඛනය

#### සාමාන්‍ය ගිණුම

වැය ශීර්ෂය සහ උප ශීර්ෂය

| | රු. | ශ. |
|---|---|---|
| ඒ1 (ර්)—විශ්‍රාම වැටුප් ... ... ... | 30,000 | 0 |
| ඒ2 (ඇෆ්)—ලිපි ද්‍රව්‍ය ආදිය ... ... ... | 12,000 | 0 |
| බී1 (ඩී) කම්කරු වැටුප් ... ... ... | 20,000 | 0 |
| බී 1 6. හරක් අල්ලන්නන්ට ගාස්තු ... | 500 | 0 |
| එකතුව ... | 62,500 | 0 |

#### විදුලිය ගිණුම

| | රු. | ශ. |
|---|---|---|
| 3. පාලනය සහ සාමාන්‍ය වියදම් — | | |
| (ජේ) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ගාස්තු ආදිය ... ... | 3,500 | 0 |

ඉහත සඳහන් පරිපූරක අයවැය ලේඛනය 1973.09.21 දින මගේ අංක 315 දරණ තීරණයෙන් පිළිගන්නා ලදී.

ඒ. ර්. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය.

1973 සැප්තැම්බර් මස 24 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කායර්‍යාලයේ දී ය.

10–148/1—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

මාතර නගරය

1973 අයවැය ලේඛනය

මුදල් රෙගුලාසි 12 (ii) යටතේ අයදුම්පත

පහත සඳහන් වැය ශීර්ෂය යටතේ වූ ඉතිරිවේ යයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයට මාරු කර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම ශීර්ෂය යටතේ යෙදීමට 1973 සැප්තැම්බර් මස 21 වැනි දින මාතර නගරය පාලනය කිරීමට පත්කර ඇති විශේෂ කොමසාරිස් වන මා මගේ තීරණ අංක 315 යටතේ සම්මත කරන ලදී.

සාමාන්‍ය ගිණුම

| ඉතිරියන් | රු. ශ. | අධිකයන් | රු. ශ. |
|---|---|---|---|
| ඊ3 (ඊ) වැසිකිලි නඩත්තුව ... ... | 3,000 0 | ඇම1 කියවීම් ශාලා සහ පුස්තකාල වේතන ... | 3,000 0 |

ජී. ටී. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්, මාතර නගරය.

1973 සැප්තැම්බර් මස 24 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය,

10–148/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

ගම්පහ නගර සභාව

1973 දෙවැනි පසුරක වැය

විදුලිය දෙපාර්තමේන්තුව

| වැය සිරස | මුදල රු. ශ. | යෝජනා අංකය සහ දිනය |
|---|---|---|
| වී.—5 (බී) මීටර් සහ අනිකුත් උපකරණ ... ... ... | 13,000 0 ... | අංක 5(2)—73.08.25 දින |
| වී.—6 (ඒ) 1 නව සේවා පිරිද්දුම් සඳහා ... ... ... | 4,000 0 ... | එම |
| වී.—6 (ඒ) 2 නඩත්තු කිරීම සඳහා ... ... | 3,000 0 ... | එම |
| වී.—15 වීථි ආලෝක කිරීම ... ... | 50,000 0 ... | එම |
| වී.—16 අළුත් විදුලි මාර්ග ඉදිකිරීම හා දීර්ඝ කිරීම ... ... | 25,000 0 ... | එම |

ඩී. ජී. වීරතුංග,
ගම්පහ නගර සභාවේ සභාපති.

10–208—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

ගලේවෙල සුළු නගර සභාව

විදුලිය අයවැය ලේඛනය—1973

1 වැනි කොටස—ආදායම

1972.12.01 වැනි දින අංක 36 දරණ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ වූ ගලේවෙල සුළු නගර සභාවේ විදුලි යෝජනා ක්‍රමයේ 1973 අයවැය ලේඛනයේ පුනරාවර්ථන වියදම් යටතේ "3—කිවි—විවිධ වියදම්" යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ලෙ. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 04 දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය

0–142—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

කෙල්දෙණිය නගරය

සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) යටතේ වූ අදයම් පත්‍රය

2 වැනි කොටස—විදුලි අංශය

1973 අය වැය ලේඛණයෙන් 2 වෙනි කොටසේ (විදුලි අංශය) වෙන් කරණ ලද මුදලින් ඉතිරිවේයයි ගණන් බලන ලද වැය ශීර්ෂය යටතේ වූ මුදල් ඊට අනුරූප දක්වෙන වැය ශීර්ෂයට මාරුකර අවශ්‍ය වැය සඳහා යෙදවීමට මවිසින් තීරණය කරණ ලදී.

| මුදල් ඉතිරි වැය ශීර්ෂය | රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| ඊඩී.—5(ඒ) ගොඩනැගිලි ... ... ... | 400 0 | ඊඩී.—4(සී) අතිකාල දීමනා ... ... | 400 0 |
| | 400 0 | | 400 0 |

ඇම්. ජී. පී. පෙරේරා,
විශේෂ කොමසාරිස්, කෙල්දෙණිය නගරය.

1973.9.8.

10–153—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

## දෙහිඕවිට සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ අයදුම්පත

### 1973 අයවැය ලේඛනය

1973 අයවැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කොට ඇති මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, ඊට අනුරූපව ඇති අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂවලට මාරු කර වියදම් කිරීමට තීරණය කරමි.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | ඉතිරි මුදල රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | අවශ්‍ය මුදල් රු. ශ. |
|---|---|---|---|
| ඒ.—2(ජී) වාහන කහඩු ගාස්තු ... ... | 500 0 | ඒ.—1(ඒ) ලේකම් ... ... ... | 500 0 |
| ඒ.—4 ආධාර හා දීමනා ... ... ... | 650 0 | ඒ.—1(ඇප්) විශ්‍රාම වැටුප් ... ... | 330 0 |
| ඩී.—1(ඒ) වැටුප් ... ... ... | 2,275 0 | ඒ.—1(ජී) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 905 0 |
| | | ඒ.—2(ඇප්) ලිපිද්‍රව්‍ය හා කාර්යාල වියදම්... ... | 1,000 0 |
| | | ඒ.—2(ඇම්) අතිකාල දීමනා ... ... | 500 0 |
| | | ඒ.—3 ආපසු ගෙවීම් ... ... ... | 40 0 |
| | | ඩී.—1(කේ) කිරි පරීක්ෂණය ... ... | 150 0 |
| එකතුව ... | 3,425 0 | එකතුව ... | 3,425 0 |

පැරකුම් විජේසිංහ,
පාලන නිළධාරි—දෙහිඕවිට සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 17 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්—කෑගල්ල.

1973 සැප්තැම්බර් මස 24 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේ දීය.

10-146—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## සුළු නගර සභාව—අම්බලන්තොට

### 1953 අය වැය ලේඛනය—මු. රෙ 40 (II) යටතේ ඉල්ලීම

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදනයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරි වේයැයි ගණන් බලන ලද මුදල් පහත සඳහන් අන්දමට යෙදවීමට හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව 1973 අගෝස්තු මස 22 වැනි දින අංක 32 දරණ තීරණයෙන් සම්මත කරන ලදී.

#### සාමාන්‍ය

| ඉතිරි වැය | රු. ශ. | අතිරේක වැය | රු. ශ. |
|---|---|---|---|
| ඩී.—(3)(ජී) ඉදිකිරීම ... ... ... | 2,000 0 | ඒ.—(2) (එෆ්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශණ සහ මුද්දර ... | 3,000 0 |
| ඩී.—(5)එච් පොදු නාන ස්ථාන ... ... | 1,000 0 | | |
| | 3,000 0 | | 3,000 0 |

#### විදුලිය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| විදු.—(6)ඒ(II) නඩත්තු කිරීම ... ... | 550 0 | විදු.—(3) (ජේ) ලිපිද්‍රව්‍ය, මුද්දර ගාස්තු, ප්‍රචාරක වියදම් සහ කාර්‍යාල වෙනත් වියදම් ... ... | 500 0 |
| | | විදු.—(3) (කිව) විවිධ වියදම් ... ... | 50 0 |
| | 500 0 | | 550 0 |

ඩී. ජයසිංහ,
පරිපාලන නිලධාරී,
අම්බලන්තොට නගරය.

1973 අගෝස්තු මස 22 වැනි දින,
අම්බලන්තොට සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

අනුමත කරමි.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

1973 අගෝස්තු මස 31 වැනි දින,
හම්බන්තොට ප.ළාත් පාලන සහකාර කොමසාරිස් කාර්‍යාලයේ දීය.

10-150—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

# දේපල විකිණීම්

### මහ නගර සභාව—දෙහිවල—ගල්කිස්ස

හිඟ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීමයි

1953 වර්ෂයේ සිට 1971 වර්ෂයේ අවසානය දක්වා මීට යාව ඇති උපලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු අය කර ගැනීමට තහනම් කිරීම සඳහා වංචල දේපල නොමැතිවූ කල්හී මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 252 ඡේදය ප්‍රකාර, මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ, (2) දූව සහ උපදින ද්‍රව්‍ය, (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත්, එකී උපලේඛනයෙහි සඳහන් දිනයන්හී පෙරවරු 8.00 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ. එච්. ඒ. සැමී,
නාගරික කොමසාරිස්,
දෙහිවල-ගල්කිස්ස.

1973 සැප්තැම්බර් මස 20 වැනි දින,
මහ නගර සභා කාර්යාලය,
දෙහිවල.

උපලේඛනය

කොට්ඨාශ අංක 10

**1973 නොවැම්බර් 1 වැනි බ්‍රහස්පතින්ද**

අපොන්සු මාවත.—15/1, 15/2, 15/3, 15/4, 15/5, 29, 12/1, 14, 14/1 2, 30, 32 ;
2

ඔබන්සයිඩ.—3, 3/1, 17, 43/1, 43/2, 45, 45/1, 55/1, 55/2, 55/3 55/15ඒ, 55/15, 55/16, 55/17, 55/18, 55/20, 55/20ඒ, 55/21ඒ.

**1973 නොවැම්බර් 2 වැනි සිකුරාද**

ඔබන්සයිඩ.—55/21, 55/22, 55/23, 55/24, 55/26, 55/28, 55/30, 55/32, 55/33, 55/34, 55/34ඒ, 55/35, 55/38, 2ඒ, 2බී, 10/1, 10/2, 10/5, 10/6, 38/1, 38/2, 38/3, 38/4, 38/5, 38/8, 38/10, 38/11, 38/12, 38/13, 38/14, 38/15, 38/15ඒ.

**1973 නොවැම්බර් 5 වැනි සඳුද**

ඔබන්සයිඩ.—38/17, 38/19, 38/21, 38/24, 38/27, 38/28ඒ, 38/33, 38/34, 38/34ඒ, 14/4, 34, 38/17ඒ ;
බාන්ස් මාවත.—12/3, 4/1ඒ, 10/1, 12/3ඒ ;
බීච් පාර.—35/2ඒ, 35/2බී, 37, 33, 16 ;
බ්‍රෝඩ්වේ පාර.—21, 37 ;
කල්දේරා පෙදෙස.—51/7, 51/8, 51/9, 32/1බී, 32/1, 32/2, 32/2ඒ, 32/5 ;

**1973 නොවැම්බර් 6 වැනි අඟහරුවාද**

කල්දේරා පෙදෙස.—32/5ඒ, 32/5බී, 32/5සී, 32/6, 32/6ඒ, 32/7, 32/8, 32/11, 32/11ඒ, 32/11බී, 32/12, 32/12ඒ, 32/12බී, 32/13, 32/14 ;
ද අල්විස් මාවත.—15/7, 15/12, 7, 15 ;
ද ජේරම් පාර.—9/1, 15/6, 17/2, 19, 28, 28ඒ, 28/1, 28/2, 34/බී, 36/11ඒ, 15, 4, 22/4 ;

**1973 නොවැම්බර් 7 වැනි බදාදා**

එදිරිවීර මාවත.—1, 1ඒ, 3, 7/1, 9/$\frac{1}{1}$, 9/$\frac{1}{2}$, 9ඒ, 10, 10/1, 10ඒ, 16, 18 18ඒ, 5ඒ, 8 ;
ගල්කිස්ස පාර.—16, 18, 20/3, 30/1, 36, 38ඒ, 42/1, 42/3, 44, 44ඒ 46, 44බී, 46/1ඒ, 46/1, 46/2, 46/6, 54, 54/1, 54/2, 54/ඒ.

**1973 නොවැම්බර් 8 වැනි බ්‍රහස්පතින්ද**

ගල්කිස්ස පාර.—54ඒ/$\frac{1}{1}$, 56, 58, 60, 60ඒ, 62, 64/1බී, 74, 76, 84ඒ 108, 110, 110ඒ, 110බී, 110සී, 116, 124/4, 124/8බී, 124/10, 124/13 124/14, 124/16, 124/20, 126, 130, 130/1, 126/1, 126/2.

**1973 නොවැම්බර් 9 වැනි සිකුරාද**

ගල්කිස්ස පාර.—138/2, 138/3, 138/4, 140, 142, 144, 144/1, 144/2 144/3, 144/7, 146/1, 200, 200/1, 202, 204, 204/1, 204/2, 208, 214ඒ 212/3ඒ, 212/3ඒ $\frac{1}{1}$, 214, 216, 218, 218/2, 218/3, 218/4, 218/6, 218/7, 220/2.

**1973 නොවැම්බර් 12 වැනි සඳුද**

ගල්කිස්ස පාර.—220/6, 220/7, 232, 236, 238, 240, 242, 124/3ඒ, 124/3$\frac{1}{1}$, 124/3$\frac{1}{2}$, 8, 38/1, 62ඒ, 124/3, 124/17$\frac{1}{1}$, 212/3.

**1973 නොවැම්බර් 13 වැනි අඟහරුවාද**

හොටෙල් පාර.—9, 11, 4/3ඒ, 8, 10/1, 20ඒ, 4/3 ;
පාසැල් මාවත.—40, 44/$\frac{1}{1}$, 62, 64 ;
සිරිපාල පාර.—9, 23ඒ, 32, 38 ;
ශ්‍රී ධර්මපාල පාර.—15/1, 15/3, 17, 17/2, 17/3, 17/3ඒ, 17/3බී, 17/4 17/4ඒ.

**1973 නොවැම්බර් 14 වැනි බදාදා**

ශ්‍රී ධර්මපාල පාර.—17/5, 17/6, 19, 19ඒ, 21, 21/4, 21/6, 21/8, 21/8ඒ, 21/9, 21/9ඒ, 21/20ඒ, 21/21, 21/22, 21/23, 23, 23/1, 23/2 23/3, 23/3ඒ, 23/4, 23/6, 35/1, 35/3, 39, 41, 16, 20/4, 20/5, 22, 26/2, 34, 34/1.

**1973 නොවැම්බර් 15 වැනි බ්‍රහස්පතින්ද**

ශ්‍රී ධර්මපාල පාර.—34/2, 34/9, 34/11, 34/13ඒ, 34/15, 34/16, 34/17, 34/18, 25/2, 22/1, 22/2, 34/13 ;
ශ්‍රී ගුනාලංකාර මාවත.—11/1, 15/2, 15/3, 10/3, 10/5, 10/6 ;
සමුද්‍රමාවත.—11.

කොට්ඨාශ අංක 2

**1973 නොවැම්බර් 16 වැනි සිකුරාද**

ශ්‍රී සරණංකර පාර.—100.

කොට්ඨාශ අංක 3

**1973 නොවැම්බර් 19 වැනි සඳුද**

රෝහලපාර.—193.

10–147—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

### කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුගම ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය විසින් 1974 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම ගැන පමුණුගම ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7(2) (ආ) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | කැරැත්තාගොඩගේ දොන් විලියම්, නො 91, බෝපිටිය, පමුණුගම | බෝපිටිය මාර්කට් හරක් මස් කඩය ... | ... හරක් මස් හා එළු මස් |
| 2. | කැරැත්තාගොඩගේ දොන් නිකුලස් අප්පුහාමි, බෝපිටිය, පමුණුගම | බෝපිටිය රා තැබෑරුම අසල හරක් මස් කඩය | ... හරක් මස් හා එළු මස් |
| 3. | මීගමුගේ විල්බට් ප්‍රනාන්දු, නො. 40, වැලිඅමුන පාර, හැඳල, වත්තල | උස්වැටකෙයාව රා තැබෑරුම අසල හරක් මස් කඩය | ... හරක් මස් හා එළු මස් |

ජී. ඩී. ද සිල්වා,
පරිපාලන නිලධාරී,
පමුණුගම ගම්සභාව.

1973 සැප්තැම්බර් මස 25 වැනි දින,
පමුණුගම පරිපාලන කාර්යාලයේදී.

10–144—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනත (261 වන අධිකාරය)**

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ ව්‍යවස්ථා" පනතේ 3. වන වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කනෝගම ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

යෝජනාව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ වර්ෂ 1972 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, ශ්‍රී ලංකා රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවල 42 වැනි කොටස, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට කනෝගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ (261 වන අධිකාරය) 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩී. පී. ඩී. බන්ඩියා,
කනෝගම ගම් සභාවේ සභාපති.

1973 සැප්තැම්බර් 27 දින,
කනෝගම ගම් සභා කාර්යාලයේ දී ය.
කටුපොත.

10–176—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

**බදුල්ල නාගරිකය**

විදුලි බල ගාස්තු ප්‍රතිශෝධනය කිරීම

වර්ෂ 1957 අංක 59 දරණ විදුලි බල (සංශෝධිත) පනතින් සංශෝධිත වර්ෂ 1950 අංක 19 දරණ විදුලි බල පනතේ 36 වෙනි ඡේදය ප්‍රකාර හා බදුලු නාගරිකය වෙත නිකුත් කර ඇති වර්ෂ 1969 මාර්තු මස 9 වැනි දින දරණ විදුලි බල පනතේ "බී" උපලේඛනයෙහි සඳහන් 8 වැනි වගන්තිය ප්‍රකාර, ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන විදුලි පරීක්ෂකතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා විසින් එම බලපත්‍රයේ සඳහන් ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බවත්, එම සංශෝධිත ගාස්තුවල ඇතුලත් වී ඇති විසන්ධි කරනු ලබන සැපයුම් නැවත සම්බන්ධ කිරීම සඳහා යෝජිත රු. 10 ක ගාස්තුව වෙනුවට මෙම නාගරිකයේ විදුලිය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ප්‍රකාර රු. 5 ක ගාස්තුවක් අය කරනු ලැබීමට යටත්ව, 1973.9.1 වෙනි දින සිට නව ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වන බවත් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

එච්. ඇම්. අබේපාල,
විශේෂ කොමසාරිස්, බදුල්ල නාගරිකය.

විශේෂ කොමසාරිස් කාර්යාලය, බදුල්ල,
1973.09.22 දින දිය.

**ගාස්තු චක්‍රය**

වැඩිම මිල හා අය කිරීමේ ක්‍රම :—

ගාස්තු අංක 1 (පහන්, පංකා හා පොදු කටයුතු සඳහා)

1. මාසික පරිහරණය :

පළමුවන ඒකක 300 ඒකකයක් ශත 55 බැගින්
දෙවන ඒකක 250 ඒකකයක් ශත 50 බැගින්
තෙවන ඒකක 250 ඒකකයක් ශත 45 බැගින්
ඒකක 800ට අමතරව සෑම ඒකකයක්ම ශත 40 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් (මනුකුලිය හැර)

3. මනුකුලිය මසකට රු. 1 බැගින්

ගාස්තු අංක 2 (ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා සඳහා)

1. මාසික පරිහරණය :

පළමුවන ඒකක 500 ඒකකයක් ශත 27 බැගින්
දෙවන ඒකක 300 ඒකකයක් ශත 25 බැගින්
තෙවන ඒකක 200 ඒකකයක් ශත 23 බැගින්
ඒකක 1000ට අමතරව සෑම ඒකකයක්ම ශත 21 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් (මනුකුලිය හැර) නැතහොත් නිර්ණිත අවශ්‍යතාවේ කි. වෝ. ඇ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1 බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනුකුලිය මසකට රු. 1 බැගින්.

ගාස්තු අංක 3 (බාහිර පහන්; සංඥා, සිනමාහල් හා නෘත්‍යශාලා සඳහා)

1. මාසික පරිහරණය :

පළමුවන ඒකක 500 ඒකකයක් ශත 35 බැගින්
දෙවන ඒකක 300 ඒකකයක් ශත 33 බැගින්
තෙවන ඒකක 200 ඒකකයක් ශත 31 බැගින්
ඒකක 1000ට අමතරව සෑම ඒකකයක්ම ශත 29 බැගින්

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් හෝ (මනුකුලිය හැර) නැතහොත් නිර්ණිත අවශ්‍යතාවේ කි.වෝ. ඇ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1 බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනුකුලිය මසකට රු. 1 බැගින්.

ගාස්තු අංක 4 (ගෘහීය කටයුතු සඳහා)

1. සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. ස්ථාවර ගාස්තුව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කළ ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිහරණය කරන ලද ඒකක සඳහා ඒකකයන් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. ස්ථාවර ගාස්තුව (මනුකුලියත් ඇතුළුවයි).

වර්ග අඩි 1,500ට නොවැඩි නම් මසකට රු. 6 බැගින්
වර්ග අඩි 1,750ට නොවැඩි නම් මසකට රු. 7 බැගින්
වර්ග අඩි 2,000ට නොවැඩි නම් මසකට රු. 8 බැගින්
වර්ග අඩි 2,250ට නොවැඩි නම් මසකට රු. 9 බැගින්
වර්ග අඩි 2,500ට නොවැඩි නම් මසකට රු. 10 බැගින්
වර්ග අඩි 3,000ට නොවැඩි නම් මසකට රු. 11 බැගින්
වර්ග අඩි 3,500ට නොවැඩි නම් මසකට රු. 12 බැගින්
වර්ග අඩි 4,000ට නොවැඩි නම් මසකට රු. 13 බැගින්
වර්ග අඩි 4,500ට නොවැඩි නම් මසකට රු. 14 බැගින්
වර්ග අඩි 5,000ට නොවැඩි නම් මසකට රු. 15 බැගින්
වර්ග අඩි 5,500ට නොවැඩි නම් මසකට රු. 16 බැගින්
වර්ග අඩි 6,000ට නොවැඩි නම් මසකට රු. 17 බැගින්
වර්ග අඩි 6,500ට නොවැඩි නම් මසකට රු. 18 බැගින්
වර්ග අඩි 7,000ට නොවැඩි නම් මසකට රු. 19 බැගින්
වර්ග අඩි 8,000ට නොවැඩි නම් මසකට රු. 20 බැගින්
වර්ග අඩි 9,000ට නොවැඩි නම් මසකට රු. 21 බැගින්
වර්ග අඩි 10,000ට නොවැඩි නම් මසකට රු. 22 බැගින්

සෑම අතිරේක වර්ග අඩි 2,000 කට හෝ ඉන් කොටසකට මසකට රු. 1 බැගින්

3. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව ඉහත උපලේඛන ගත කර ඇති ස්ථාවර ගාස්තුව අනුව විය යුතුය.

4. වර්ග ප්‍රමාණයෙන් සියයට 25ට අඩු ගෙවීම් ප්‍රමාණයක් වෘත්තීය හෝ වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන ගෘහීය ස්ථාපන සඳහා ස්ථාවර ගාස්තුව ගණන් බැලීමේදී ගෘහීය කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන කොටස් වෙනුවෙන් ඉහත දක්වෙන 2 වැනි ඡේදය යටතේද වෘත්තීය හෝ වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන විදුලි බලය වෙනුවෙන් ස්ථාවර ගාස්තුව අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේද පිළියෙල කරනු ලැබේ.

5. වාසස්ථානයේ 'ගෙබිම' යන්නෙන් අදහස් කරනු ලබන්නේ එම වාසස්ථානයට අයත් ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ සියළුම ස්ථිර ගොඩනැගිලිවල මුළු බාහිර ගෙබිම් ප්‍රමාණය වේ.

ගාස්තු අංක 5 (කාර්මික කටයුතු සඳහා)

1. මෙමු ගාස්තු ක්‍රමය පහන් හා පංකා බැර බල බැර මෙන් සියයට හතලිහකට නොවැඩි කර්මාන්ත ශාලාවල, වැඩපොලවල, වාත්තු මඩුවල, තෙල් මෝල්වල, නූල් කැටීමේ හා රෙදි විවීමේ මෝල්වල, කොහු මෝල්වල, ලී මෝල්, සහල් මෝල්, පොම්ප කරන ස්ථානවල සහ වෙනත් එවැනි කාර්මික ස්ථානවල ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික නොහොත් විද්‍යුත් තාප ක්‍රියාවලින් සම්පූර්ණ වශයෙන්ම හෝ ප්‍රධාන වශයෙන්ම භාවිතා කෙරෙන විදුලිය වෙනුවෙන් අදල වන්නේය.

මෙම සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. අවශ්‍යතාව හා උපරිම අවශ්‍යතාව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කල ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිහරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. අවශ්‍යතා ගාස්තුව (මනු කුළියත් ඇතුළුවයි) :

නිර්ණිත අවශ්‍යතාව කි. වෝ. ඇ. 20කට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට කි. වෝ. ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 9 බැගින් කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තු වනුයේ රු. 48 ක අඩුම ගාස්තුවකට යටත්වූ නිර්ණිත අවශ්‍යතාවේ කි. වෝ. ඇ. සංඛ්‍යාව අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුළියත් ඇතුළුවයි) :

කි. වෝ. ඇ. 20කට වැඩි ස්ථාපන වෙනුවෙන් උපරිම අවශ්‍යතාවේ මුල් කි. වෝ. ඇ. 50 හෝ එක් එක් කි. වෝ. ඇ. වෙනුවෙන් කි. වෝ. ඇ. එකක් රු. 9 බැගින්. උපරිම අවශ්‍යතාවේ කි. වෝ. ඇ. 50ට වැඩිවූ කි. වෝ. ඇ. 100ට නොවැඩි එක් එක් කි. වෝ. ඇ. වෙනුවෙන් කි. වෝ. ඇ. එකක් රු. 8.50 බැගින්. උපරිම අවශ්‍යතාවේ කි. වෝ. ඇ. 100ට වැඩි සෑම කි. වෝ. ඇ. එකක් වෙනුවෙන් කි. වෝ. ඇ. එකක් රු. 8 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 180 කි.

## ගාස්තු අංක 6 (වාණිජ කටයුතු සඳහා)

1. මෙම ගාස්තු ක්‍රමය සාප්පුවල, කාර්යාලවල, බැංකුවල, ගුදම්වල, බලපත්‍ර ලත් හෝටල්වල, තේ පැන් ශාලාවල, පොදු ගොඩනැගිලිවල, රෝහල්වල, දුම්රිය පොලවල, අධ්‍යාපනික ආයතනවල හා වෙනත් එවැනි ස්ථානවල භාවිතා කෙරෙන විදුලි බලය සැපයීම වෙනුවෙන් අදාල වන්නේය.

මෙම සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. අවශ්‍යතාවය හා උපරිම අවශ්‍යතාව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කළ ගාස්තුවකින්ද, සියළුම කටයුතු සඳහා පරිහරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 15 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. අවශ්‍ය ගාස්තුව (මනු කුළියත් ඇතුළුවයි). නිර්ණිත අවශ්‍යතාව කි. වෝ. ඇ. 20කට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට එක් එක් කි. වෝ. ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 16 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 48 ක අඩුම ගාස්තුවකට යටත්වූ නිර්ණිත අවශ්‍යතාවේ කි. වෝ. ඇ. ප්‍රමාණය අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුළියත් ඇතුළුවයි). කි. වෝ. ඇ. 20කට වැඩි ස්ථාපන වෙනුවෙන් උපරිම අවශ්‍යතාවේ මුල් කි. වෝ. ඇ. 50හේ එක් එක් කි. වෝ. ඇ. වෙනුවෙන් කි. වෝ. ඇ. එකක් රු. 16 බැගින් උපරිම අවශ්‍යතාවේ කි. වෝ. ඇ. 50ට වැඩි වූ කි. වෝ. ඇ. 100ට නොවැඩි එක් එක් කි. වෝ. ඇ. වෙනුවෙන් කි. වෝ. ඇ. එකක් රු. 14 බැගින්. උපරිම අවශ්‍යතාවේ කි. වෝ. ඇ. 100ට වැඩි සෑම කි. වෝ. ඇ. එකක් රු. 12 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 320 කි.

4. එක් එක් පහන් අල්ලුවක් වෙනුවෙන් වොට් 25කට නොඅඩු පහන් බැර තක්සේරුවකට අවශ්‍යතා ගාස්තු උපලේඛනය යටත් වනු ඇත.

5. සියන් පංකා බැර තක්සේරු කල යුත්තේ එකකට වොට් 50 බැගින්.

## ගාස්තු අංක 7 (තාවකාලික ආලෝක කිරීම් සඳහා)

1. දැනට පවත්නා මනුවට අතිරේක අවශ්‍යතාව දැරිය හැකිනම් දැනට සිටින පාරිභෝගිකයන්ගෙන් ඔවුනට නියමිත ගාස්තු ක්‍රම අනුව විදුලි බල ගාස්තු අයකරනු ලැබේ.

(අ) දැනට පවත්නා මනුවක් මගින් විදුලි බලය සපයන විට විදුලිබල ගාස්තුවට අතිරේකව රුපියල් 5ක ගාස්තුවක් අයකරනු ලැබේ.

(ආ) විශේෂ මනුවක් මගින් විදුලි බලය සපයන විට අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමයට අතිරේක රුපියල් 10ක ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගාස්තු ක්‍රමය ප්‍රසිද්ධ සිද්ධස්ථානවලට අදල නොවන්නේය.

2. තාවකාලික පාරිභෝගිකයන්ගෙන් අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමය යටතේ විදුලිබල ගාස්තු අයකරනු ලැබේ. මීට අතිරේකව මනු සහ සේවා ගාස්තු අයකරනු ලැබේ.

## ගාස්තු අංක 8 (ප්‍රසිද්ධ සිද්ධස්ථාන සඳහා)

මෙම ගාස්තු ක්‍රමය මහජනයා වැඳුම් පිදුම් කරන ස්ථානයක් ඇතුලත පිහිටියාවූත්, වැඳුම් පිදුම් කරන ස්ථානයේ පූජකවරුන් පදිංචිව සිටින්නාවූත්, නේවාසිකාගාර ඇතුළු ප්‍රසිද්ධ සිද්ධස්ථාන වල භාවිත කෙරෙන විදුලිය සැපයීම වෙනුවෙන් අදල වන්නේය.

ඒකකයක් ශත 20 බැගින් ;

මනු කුලිය රු. 1 යි,

## විවිධ ගාස්තු

1. ස්ථාපන පරීක්ෂා කිරීම :—

(අ) නව ස්ථාපන සහ පවත්නා ස්ථාපන විශාල කිරීම පළමුවරට පරීක්ෂා කිරීම නොමිලයේ ;

(ආ) පළමුව පරීක්ෂණය අසතුටුදායක නම් එක් එක් අතිරේක පරීක්ෂණයක් සඳහා —

සම්පූර්ණ ස්ථාපන රු. 10 යි.

විශාල කිරීම් රු. 5 යි.

2. මනු පරීක්ෂා කිරීම —

පාරිභෝගිකයාගේ අයදුම් මත මනුව පරීක්ෂා කිරීමට රු. 5 යි.

මනුවේ දෝෂය සියයට 2½ කට අඩු හෝ වැඩි නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

3. නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු —

(අ) මුදල් නොගෙවීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවත සම්බන්ධ කිරීම රු. 5යි ;

(ආ) නියෝග කඩ කිරීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවතත් සම්බන්ධ කිරීමට රු. 15 යි ;

(ඇ) පැය 48කට අඩු කාලයකින් දැනුම් දුන් විට විශේෂ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව රු. 2යි.

4. සැපයුම බිඳ වැටීම —

විලායකකරුවන්ගේ සේවය සඳහා ගාස්තුව රු. 2 යි.

## සටහන්

1. ගාස්තු ක්‍රම අංක 5 සහ 6

මුළු පරිහරණ ප්‍රමාණයටම, අදල ගාස්තු ක්‍රමය යටතේ මුදල් අයකෙරෙනු ඇත. එසේ නැත හොත් පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි පහන්, පංකා, ශීතකරණ සහ අධිශීතකරණ සඳහා අංක 1 දරණ ගාස්තු ක්‍රමය යටතේද, ගාමක බලය සඳහා සහ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාපක ක්‍රියා අංක 2 දරණ ගාස්තු ක්‍රමය යටතේද මුදල් අය කෙරෙනු ඇත.

අංක 4 දරණ ගෘහීය ගාස්තු ක්‍රමයේ 4 වැනි ඡේදය යටතේ වෘත්තීය හෝ වෙළඳ බැර තක්සේරු කිරීමේදී ස්ථාවර ගාස්තුව ප්‍රමාණනුකූල ක්‍රමයකට කිට්ටුම ඊලඟ සම්පූර්ණ රුපියලට නිශ්චය කෙරෙනු ඇත. මෙහිදී අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේ අඩුම ගාස්තුව අදල නොවන්නේය.

මසකින් කොටසකට සැපයුම සඳහා ස්ථාවර ගාස්තුව අඩුම ගාස්තුව හා මනු කුලිය ප්‍රමාණානුකූල ක්‍රමයකට ගණන් ගනු ඇත.

උපරිම අවශ්‍යතා කි. වෝ. ඇ. වනුයේ මිනිත්තු 15ක කාලයක් තුල ප්‍රකාශිත වෝල්ටීයතාව අනුව ගිනු විදුලි බල ප්‍රමාණය වේ.

---

ගාමක බලය = Motive Power

විද්‍යුත් රසායනික = Electro Chemical

විද්‍යුත් තාප = Electro Thermal

නිර්ණිත අවශ්‍යතාව = Assessed Demand

අවශ්‍යතා ගාස්තුව = Demand Charge

උපරිම අවශ්‍යතා ගාස්තුව = Maximum Demand Charge

මනුව = Meter

ස්ථාපන = Installations

විලායකකරුවන් = Fusemen

ප්‍රමාණානුකූල = Prorata Basis

සියන් පංකා = Ceiling Fans

10–151—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුලිය ඇතුලුවයි) : කි. වො. ඇ. 20 කට වැඩි ස්ථාපන වෙනුවෙන්, උපරිම අවශ්‍යතාවේ මුල් කි.වො.ඇ. 25 හේ එක් එක් කි.වො.ඇ. වෙනුවෙන් කි.වො.ඇ. එකක් රු. 16 බැගින්. උපරිම අවශ්‍යතාවේ කි.වො.ඇ. 25 කට වැඩි වූ කි.වො.ඇ. 50කට නොවැඩි එක් එක් කි.වො.ඇ. වෙනුවෙන් කි.වො.ඇ. එකක් රු. 14 බැගින්. උපරිම අවශ්‍යතාවේ කි.වො.ඇ. 50කට වැඩි සෑම කි.වො.ඇ. එකක් රු. 12 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 320 කි.

4. එක් එක් පහන් අල්ලුවක් වෙනුවෙන් වොට් 25 කට නොඅඩු පහන් බැර තක්සේරුවකට අවශ්‍යතා ගාස්තු උපලේඛනය යටත් වනු ඇත.

5. පියන් පංකා බැර තක්සේරු කල යුත්තේ එකකට වොට් 50 බැගින්.

ගාස්තු අංක 7 (තාවකාලික ආලෝක කිරීම් සඳහා)

1. දැනට පවත්නා මනුවට අතිරේක අවශ්‍යතාව දැරිය හැකිනම් දැනට සිටින පාරිභෝගිකයන්ගෙන් ඔවුනට නියමිත ගාස්තු ක්‍රම අනුව විදුලි බල ගාස්තු අයකරනු ලැබේ.

(අ) දැනට පවත්නා මනුවන් මගින් විදුලි බලය සපයන විට විදුලි බල ගාස්තුවට අතිරේකව රුපියල් 5ක ගාස්තුවක් අයකරනු ලැබේ.

(ආ) විශේෂ මනුවක් මගින් විදුලි බලය සපයන විට අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමයට අතිරේක රුපියල් 10 ක ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගාස්තු ක්‍රමය ප්‍රසිද්ධ සිද්ධස්ථානවලට අදාල නොවන්නේ ය.

2. තාවකාලික පාරිභෝගිකයන්ගෙන් අංක 1 දරන පොදු ගාස්තු ක්‍රමය යටතේ විදුලිබල ගාස්තු අයකරනු ලැබේ. මීට අතිරේකව මනු සහ සේවා ගාස්තු අයකරනු ලැබේ.

ගාස්තු අංක 8 (ප්‍රසිද්ධ සිද්ධස්ථාන සඳහා)

මෙම ගාස්තු ක්‍රමය මහජනයා වැඳුම් පිදුම් කරන ස්ථානයේ ඇතුලත පිහිටියාවූත්, වැඳුම්පිදුම් කරන ස්ථානයේ පූජකවරුන් පදිංචිව සිටින්නාවූත්, නේවාසිකාගාර ඇතුලු ප්‍රසිද්ධ සිද්ධස්ථාන වල භාවිත කෙරෙන විදුලිය සැපයීම වෙනුවෙන් අදාල වන්නේ ය.

ඒකකයක් ශත 20 බැගින්,

මනු කුලිය රු. 1 බැගින්.

**විවිධ ගාස්තු**

1. ස්ථාපන පරීක්ෂා කිරීම :—

(අ) නව ස්ථාපන සහ පවත්නා ස්ථාපන විශාල කිරීම් පළමුවරට පරීක්ෂා කිරීම් පනාවලයේ

(ආ) පළමුව පරීක්ෂණය අසතුටුදායක නම් එක් එක් අතිරේක පරීක්ෂණයක් සඳහා—

සම්පූර්ණ ස්ථාපන රු. 10 යි.
විශාල කිරීම් රු. 5 යි.

2. මනු පරීක්ෂා කිරීම.—පාරිභෝගිකයාගේ අයදුම් මත මනුව පරීක්ෂා කිරීමට රු. 5 යි. මනුවේ දෝෂය සියයට 2½ කට අඩු හෝ වැඩි නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

3. නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු :

(අ) මුදල් නොගෙවීම් මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවත සම්බන්ධ කිරීම රු. 10 යි.

(ආ) නියෝග කඩ කිරීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම් නැවතත් සම්බන්ධ කිරීමට රු. 15 යි ;

(ඇ) පැය 48 කට අඩු කාලයකින් දැනුම් දුන් විට විශේෂ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව රු. 2 යි.

4. සැපයුම බිඳ වැටීම :—

විලායකකරුවන්ගේ සේවය සඳහා ගාස්තුව රු. 2 යි.

**සටහන්**

| | |
|---|---|
| 1. ගාස්තු ක්‍රම අංක 5 සහ 6 | මුලු පරිහරණ ප්‍රමාණයටම, අදාල ගාස්තුක්‍රමය යටතේ මුදල් අය කෙරෙනු ඇත. එසේ නැතහොත් පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි පහන්, පංකා, ශීතකරන සහ අධිශීතකරන සඳහා අංක 1 දරන ගාස්තු ක්‍රමය යටතේ ද, ගාමක බලය සඳහා සහ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාපක ක්‍රියා අංක 2 , දරණ ගාස්තු ක්‍රමය යටතේ ද මුදල් අය කෙරෙනු ඇත. අංක 4 දරණ ගෘහීය ගාස්තු ක්‍රමයේ 4 වැනි ඡේදය යටතේ වෘත්තීය හෝ වෙළඳ බැර තක්සේරු කිරීමේදී ස්ථාවර ගාස්තුව ක්‍රමානුකූල ක්‍රමයකට කිට්ටුම ඊළඟ සම්පූර්ණ රුපියලට නිශ්චය කෙරෙනු ඇත. මෙහිදී අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේ අඩුම ගාස්තුව අදාල නොවන්නේ ය. මසකින් කොටසකට සැපයුම සඳහා ස්ථාවර ගාස්තුව අඩුම ගාස්තුව හා මනු කුලිය ප්‍රමානකූල ක්‍රමයකට ගණන් ගනු ඇත. උපරිම අවශ්‍යතා කි. වො. ඇ. වනුයේ මිනිත්තු 15 ක කාලයක් තුළ ප්‍රකාශිත වොල්ටියතාව අනුව ගිනු විදුලි බල ප්‍රමාණය වේ. |

10–106—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

**හලාවත නගරය**

නගර සභා ආඥාපනත

1974 වර්ෂයේ වාහන හා සත්ව බද්ද

255 වැනි අධිකාරය වන, නගර සභා ආඥා පනතේ, 162 වැනි වගන්තිය යටතේ පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන් අනුව 1974 වර්ෂය තුළ වාහන හා සත්ව පිළිබඳ බද්දක් පනවා අය කරනු ලබන බවත්, එකී ආඥාපනතේ අංක 163 (3) දරණ ඡේදය යටතේ එම බදු, 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

ඇම්. බී. ද ඉසෙඩ් රාජපක්ෂ,
විශේෂ කොමසාරිස්,
හලාවත නගරය.

1973.09.20 දින,
හලාවත නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, ට්‍රයිකාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල් කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් නොවන වෙන ඕනෑම වාහනයකට ... ... | 5 0 |
| ඕනෑම බයිසිකලයකට, රෝද තුනේ බයිසිකලයකට— | |
| (අ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 3 0 |
| (ආ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි නොකරන්නේ නම් ... | 1 0 |
| ගොන් දෙන්නා බඳින ඕනෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 5 0 |
| තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... | 3 0 |
| ඕනෑම අත් කරත්තයකට ... ... | 3 0 |
| ජින් රික්ෂෝවකට ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙකුට ... | 2 50 |

10-141/1—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

**හලාවත නගරය**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

1974 වර්ෂයේ සුනඛ බද්ද

477 වැනි අධිකාරය වන, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි ඡේදය යටතේ 1974 වර්ෂය තුළ හලාවත නගර සීමාව තුළ තබා ගන්නා සුනඛයින් ලියාපදිංචි කිරීම සඳහා පහත සඳහන් ගාස්තු අයකරන බවත්, එම ලියාපදිංචි කිරීමේ ගාස්තු, 1974 මාර්තු මස 31 වැනි දින හෝ එයට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

| | |
|---|---|
| සෑම බල්ලෙකු සඳහා ... ... | රු. 1 00 |
| සෑම බැල්ලක සඳහා ... ... | රු. 2 00 |

ඇම්. බී. ද ඉසෙඩ් රාජපක්ෂ,
විශේෂ කොමසාරිස්,
හලාවත නගරය.

1973.09.20 දින,
හලාවත නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10-141/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

පස්සර විශේෂ කොමසාරිස් කාර්යාලය

1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

(477 වැනි අධිකාරය)

477 වැනි අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, පස්සර සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1.00 ක් බැගින් ද, ගැනු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද, 1974 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට අයකිරීමට පනවා ඇති බව නත් නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ටී. අයි. කමාල්දීන්,
විශේෂ කොමසාරිස්,
පස්සර නගරය.

පස්සර නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේදී,
1973 සැප්තැම්බර් මස 20 වෙනි දින.

10-104/1—73.10.5 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

විශේෂ කොමසාරිස් කාර්යාලය

පස්සර නගරය

1974 වර්ෂය සඳහා රථ වාහන හා සත්ව බද්ද

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

පස්සර විශේෂ කොමසාරිස් කාර්යාලය විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත උප ලේඛණයේ විස්තර වන ගණන් අනුව, 1974 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) දරණ වගන්තිය යටතේ, එකී බදු 1974 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ටී. අයි. කමාල්දීන්,
විශේෂ කොමසාරිස්,
පස්සර නගරය.

පස්සර නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේදී,
1973 සැප්තැම්බර් මස 20 වැනි දින.

උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මොටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ, පාපැදි, සෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කරන්නේ නම් ... | 5 00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 1 00 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... | 4 00 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික් කලයක් සඳහා ... | 4 00 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | 2 50 |
| සෑම රික්ෂෝ රථයක් සඳහා ... | 2 50 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 00 |
| සෑම අශ්වයෙක්, ජෙන්නියෙක් හෝ කොටළුවෙක් සඳහා ... ... ... | 2 50 |

10–104/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි හා 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පිළියෙල කරන ලදුව, එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත් කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවුන දින සිට රුවන්වැල්ල සුලු නගර සභා ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත්, 1972 මැයි 29 වැනි දින අංක 19 දරණ සභා සම්මුතිය යටතේ රුවන්වැල්ල සුලු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

බී. ඇම්. හේමපාල දසනායක,
සභාපති,
රුවන්වැල්ල සුලු නගර සභාව.

1973 සැප්තැම්බර් 20 වැනි දින,
රුවන්වැල්ල සුලු නගර සභා කාර්යාලය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 නොවැම්බර් 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරණු ලැබේ :—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක" හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උප ලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ"; තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උප ලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

උපලේඛනය

1 වැනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂනය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගිණි පෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉටිපන්දම් කරවත් වෙනුවට ...
ඉඹුල් පුලුන් හෝ කපු හෝ කපු පුලුන් ගබඩා කර තබා ගැනීම.
මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
ගිරිගල් හෝ හුනුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත් වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩාකර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම් (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

## II වැනි කොටස

## අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩාකර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුනු මාලු හෝ ජාඩි හොන්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ඇලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි හැදීම.
අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කල භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.
රසකැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ෂනය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
තීන්ත නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
පලතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.
බේකිං පවුඩර් නිපදවීම.
මාජරීන් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොටි නිපදවීම.
ඉටි පන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.
පාසල් රටහුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.
ශීත කල මස් හෝ මාළු ගබඩා කර තැබීම.
කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යෑම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු සුදු (වයිට්ං) හුණු හෝ ගිරිගල් නිපදවීම.
ඒන්සල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

## අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, (කරදමුංගු) එන්සාල්, හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.
විද්යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිනි කෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හොන්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.
බැටරි චාජ් කිරීම හෝ අලුත් වැඩියා කිරීම.
වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
චිත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යෑම.
ගුල් ස්මාරක නිපදවීම.
පැට්රෝල්, ඩිසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වා ගෙන යෑම.
පැට්රෝල් තිකුත් කරන ස්ථානයක් පවත්වා ගෙන යෑම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කව (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල්තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වර්නයිස් කිරීම.
පාස්න ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇන නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර, ශීත කරණ හෝ අධි ශීත කරණ (ඩීප් ප්‍රීසර්) නිපදවීම සර්විස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම.
බ්රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවුණු රෙදි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
ට්රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත් වැඩියා කරන හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වා ගෙන යෑම.

10-41—73.10.05 දින අංක 80 දරන ගැසට් පත්‍රය

---

### බෙලිඅත්ත නගරය

#### 1974 වර්ෂයට දේපළ බද්ද

බෙලිඅත්ත නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් (256 වන අධිකාරය) වන සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි ඡේදය යටතේ 1973 වර්ෂයට පණවන ලද දේපළ බද්ද එලෙසම පහත පෙනෙන ලෙස 1974 වර්ෂයට පැණවූ බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බෙලිඅත්ත නගර සීමාව තුළ සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හත (7) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් 1974 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දයින් අවසන් වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැක.

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්,
බෙලිඅත්ත නගරය.

1973 සැප්තැම්බර් 18 වැනි දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
බෙලිඅත්ත නගරය,
බෙලිඅත්ත.

10-38—73.10.05 දින අංක 80 දරන ගැසට් පත්‍රය

---

### අටකලන් කෝරලේ පන්නිල්පත්තු ගම්සභාව

#### පුස්තකාල අතුරු ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා අටකලන් කෝරලේ පන්නිල්පත්තු ගම්සභාවේ මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථා නමින් හැඳින්වේ.

අටකලන් කෝරලේ පන්නිල්පත්තු ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අශංයන්ගෙන් සමන්විත වේ.

(අ) මහජන පුස්තකාලය
(ආ) කියවීම් ශාලාව

2. (1) මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම හා පාලනය අටකලන් කෝරලේ පන්නිල් පත්තු ගම්සභාව සතුවේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් සභාපති තුමාට උපදෙස් ලබාගැනීම සඳහා සුදුසු උපදේශක මණ්ඩලයක් පත් කර ගත හැකිය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීමට හා පාලනය කිරීම ආදි කටයුතු සභාපති තුමාගේ උපදෙස් අනුව පුස්තකාල භාරකරු විසින් ඉටු කළ යුතුයි.

3. පුස්තකාල සේවය ඕනෑම කෙනකුට හෝ අනුමත කරන ලද ප්‍රජා මණ්ඩලයකට පැවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම සභාපති තුමා සතු බලයකි. තවද පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජා මණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට සභාපති තුමාට බලය තිබේ.

4. **මහජන පුස්තකාලය.**—(1) පුස්තකාලයේ සාමාජිකයෙකු වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය:—

(අ) වයස අවුරුදු 12 කට අඩු නොවීම.
(ආ) සාමාන්‍යයෙන් ලිවීම හා කියවීමට හැකි අයෙකුවීම.
(ඇ) ගම්සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවන් හෝ ගම්සභා ප්‍රදේශය තුළ ස්ථිර රැකියාවක නියුතු අයෙකුවීම.
(ඈ) ගම්සභාව වෙත රු. 5 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

(2) සාමාජිකත්වය ලබාගැනීමට කැමැති අයවලුන් ගම්සභාවෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මගින් ඒ සඳහා ඉල්ලා සිටිය යුතුය. එවැනි සෑම ඉල්ලුම් පත්‍රයක්ම පහත සඳහන් අයගෙන් කෙනෙකු විසින් සහතික කර තිබිය යුතුයි.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු.
(ආ) සමාදාන විනිශ්චයකරුවෙකු.
(ඇ) ගම්සභා නියෝජිතයෙකු.
(ඈ) පුස්තකාල උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු,
(ඉ) ගම්සභා ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථානයක නායක පූජක තුමෙකු.
(ඊ) රු. 100 ට නොඅඩු මූලික වැටුප් ලබන ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි රජයේ හෝ පළාත් පාලන සේවයේ නිලධාරියකු.
(උ) රජයේ හෝ රජයේ ලියාපදිංචි පාඨශාලාවක ප්‍රධානාචාර්යවරයෙකු.

(3) 4 (2) වැනි ව්‍යවස්ථාව අනුව අයදුම් පතක සහතික කිරීමට සුදුසුකම් ඇති අයෙකුට තමාගේ අයදුම් පත්‍රය සම්බන්ධයෙන් එවැනි සහතිකයක් අත්සන් කළ නොහැකිය.

(4) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබීම සඳහා ප්‍රජා මණ්ඩලවලට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

(අ) සාමාජිකත්වය අපේක්ෂා කරනු ලබන ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි කිරීම සඳහා ගම්සභාව විසින් අනුමත කර තිබිය යුතුයි,
(ආ) සාමාජිකයින් 25 දෙනකුට වැඩි ගණනක් සිටින ප්‍රජා මණ්ඩලයක් වීම,
(ඇ) ගම්සභා ප්‍රදේශය තුළ පිහිටි ප්‍රජා මණ්ඩලයක් වීම,
(ඈ) ගම්සභාව වෙත රු. 25 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම,
(ඉ) පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගැනීමට ප්‍රජා මණ්ඩලයේ මහ සභා රැස්වීමකින් අනුමත වී තිබීම,
(ඊ) පුස්තකාලයෙන් භාරගනු ලබන පොත් වල වගකීම ප්‍රජා මණ්ඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන නිලධාරීන් තිදෙනා විසින් දැරිය යුතු බවට ප්‍රජා මණ්ඩලයේ මහ සභා රැස්වීමේදී අනුමත වී තිබීම.

(5) සාමාජිකත්වය ලබාගැනීමට කැමති ප්‍රජා මණ්ඩල ගම්සභාවෙන් ලබාගත හැකි නියමිත අයදුම් පත්‍ර මගින් ඒ සඳහා ඉල්ලා සිටිය යුතුය. එවැනි සෑම ඉල්ලුම් පත්‍රයක්ම 4 (2) වැනි ව්‍යවස්ථාවෙන් විස්තර වන අයෙකු විසින් සහතික කර තිබිය යුතුයි.

(2) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ දැනගැනීම සඳහා කියවීම් ශාලාවේ අවු වශයෙන් දින පසකට (5) වත් කලින් දැන්වීමක් මගින් ප්‍රචාරය කර 24(1) දරන වගන්තියෙන් නියම කර ඇති කාල සීමාවන් වෙනස් කිරීමට සභාපතිතුමාට බලය තිබේ.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක්, සඟරාවක්, පිටපතක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසිම දේපොළක් කිසිවෙකු කියවීම් ශාලාවෙන් පිටතට ගෙන යා යුතු නැත.

26. බෝවෙන රෝගයකින් පෙලෙන කිසිම කෙනෙකු රෝග උපද්‍රව කාලසීමාව ඉක්මවා යනතුරු "මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට" ඇතුළු නොවිය යුතුය.

27. කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට ගිරිහැර වන අන්දමින් නො හැසිරිය යුතුය.

(1) කියවීම් ශාලාව හා පුස්තකාලය වසාඇති වේලාවන්හිදී නිකරුණේ ඒ අසල නොහැසිරිය යුතුය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට ඇති ගම් සභාව සතු වූ ගොඩනැගිලිවලට හෝ වෙනත් දේපළවලට කිසිම අලාභ හානියක් නොකළ යුතුය.

(3) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම්බීම හා කෙළ ගැසීම නොකළ යුතුය.

(4) මහජන පුස්තකාලය තුළදී හෝ ඒ අසල කිසිවෙකු විසින් දාදුවලින් හෝ කඩදාසි වලින් සූදු කෙළීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතුය.

(5) පුස්තකාලය හා කියවීම් ශාලාව ඇතුළත හෝ ඒ අසල කෑ ගැසීම, සින්දු කීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(6) අපිරිසිදුලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

---

## කුන්පනේ උඩපළාත නැගෙනහිර ගම් සභාවේ විදුලිය බලය සැපයීමට බලයලත් ප්‍රදේශ දීර්ඝ කිරීම

වර්ෂ 1950 අංක 19 දරන විදුලිබල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වනි දින අංක 10,890 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව කුන්පනේ උඩපළාත නැගෙනහිර ගම් සභාවට නිකුත් කර ඇති වර්ෂ 1970 මාර්තු මස 24 වැනි දින දරන විදුලි බල පත්‍රයේ 'ඒ' උපලේඛණයෙහි සඳහන් විදුලි බලය සැපයීමට බලයලත් ප්‍රදේශ පහත දැක්වෙන පරිදි දීර්ඝ කිරීම පිළිබඳව මා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු වර්ෂ 1973 ඔක්තෝබර් මස 19 වෙනි දින පස්වරු 1.00 ට ගම් සභා කාර්යාලයේදී විභාගයක් පවත්වනු ලබන බව සියලු දෙනාටම මෙයින් දනුම් දෙනු ලැබේ.

දීර්ඝ කරනු ලබන ප්‍රදේශ:—

මඩිගේ-වල්පොල තැන්න මාර්ගයේ කොස්පොකු ඔය අසල සිට පවල්පාව සන්දිය දක්වා සහ එම මාර්ගයේ මැද සිට දම්වැල් 10 බැගින් දෙපසටද,

---

## වතුගෙදර සුළු නගර සභාවේ විදුලි බලය සැපයීමට බලයලත් ප්‍රදේශය කෙටි කිරීම

වර්ෂ 1950 අංක 19 දරන විදුලි බල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වැනි දින අංක 10,899 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව වතුගෙදර සුළු නගර සභාවට නිකුත් කර ඇති වර්ෂ 1959 දෙසැම්බර් මස 2 වැනි දින දරන විදුලි බල පත්‍රයේ 'ඒ' උපලේඛණයෙහි සඳහන් විදුලි බලය සැපයීමට බලයලත් ප්‍රදේශ පහත දක්වෙන පරිදි කෙටි කිරීම පිළිබඳව මා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු වර්ෂ 1973 ඔක්තෝබර් මස 30 වැනි දින පෙරවරු 11.00 ට සුළු නගර සභා කාර්යාලයේදී විභාගයක් පවත්වනු ලබන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

කෙටි කරනු ලබන ප්‍රදේශය:—

වර්ෂ 1969 අප්‍රේල් මස 25 වැනි දින ප්‍රසිද්ධ කළ අංක 14,850/10 දරණ ගැසට් පත්‍රයේ සඳහන් හෙජ්පුමුල්ල ප්‍රදේශය.

ගේ දැනගැනීම සඳහා
ා (5) වන් කලින් දැන්වී
වස්ථාවෙන් නියම කර
තිතුමාට බලය තිබේ.

ක්, සඟරාවක්, සිතියමක්,
ාළක් කිසිවෙකු කියවීම්

ම කෙනෙකු රෝග පැතිර
හජන පුස්තකාලයට හෝ

ළු හෝ ඒ අසල නොමනා
දමින් නො හැසිරිය යුතුය.

සඇති වේලාවන් හිදී නික
තුය.
ළු හෝ ඒ අවට ඇති ගම්
හෝ වෙනත් දේපළවලට
යුතුය.

ළු දුම්බීම හා කෙළ ගැසීම

අසල කිසිවෙකු විසින්
සූදු කෙලීම හෝ මුදල්
ක් කිරීම හෝ නොකළ

ඇතුළත හෝ ඒ අසල සෑ
ශබ්ද ආදිය කිරීමෙන්
පාවිච්චි කරන්නන්ට බාධා

පුස්තකාලයට ඇතුළු නො

(7) බල්ලන් හෝ බළලුන් හෝ වෙනත් කිසිම සතුන් පුස්තකාලයට හා කියවීම් ශාලා භූමියට නොගෙනා යුතුය.

(8) "මහජන පුස්තකාලය හා කියවීම් ශාලාව" තුළ හෝ ඒ අසල නිදාගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතුය.

(9) පුස්තකාල භාරකරු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීමට බලය පවරන ලද අයෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යානුකූලව ඉටුකරනු ලබන කටයුතු වලට කිසිවෙකු විසින් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" හෝ "සභාපතිතුමා" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල්පත්තු ගම්සභාවේ සභාපතිතුමා ද,

"ගම්සභාව" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල්පත්තු ගම් සභාව ද,

"ගම්සභා ප්‍රදේශය" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල් පත්තු ගම්සභා ප්‍රදේශය ද,

"පුස්තකාලය භාරකරු" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල් පත්තු ගම්සභාව මගින් පත් කරන ලද පුස්තකාලයේ භාරකරු ද,

"සාමාජිකයෙකු" යනුවෙන් 4(1) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයෙකු හෝ 4(4) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජා මණ්ඩලයක් ද,

අදහස් කෙරේ.

පී. ඇන්. ජයසුන්දර,
අටකලන් කෝරළේ
පන්නිල්පත්තු ගම්සභාවේ සභාපති.

1973 සැප්තැම්බර් මස 17 වැනි දින,
පන්නිල්පත්තු ගම්සභා කාර්යාලය,
වැල්ලඳුර, කහවත්ත.

10-91—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

ාවේ විදුලිය බලය සැපයීමේ
ස කිරීම

ාහේ 9 වැනි ඡේදය හා ඒ
න අංක 10,899 දරන ගැසට්
ප්‍රකාර මා වෙත පැවරී ඇති
ගනහිර ගම් සභාවට නිකුත්
දින දරන විදුලි බල පත්‍රයේ
බලය සැපයීමේ බලයලත්
ම පිළිබඳව ම විසින් බලය
ඔක්තෝබර් මස 19 වෙනි
යේ දී විභාගයක් පවත්වනු
ව දෙනු ලැබේ.

කොස්පොතු ඔය අසල සිට
බ එම මාර්ගයේ මැද සිට

රඹුක්කන-ගලගෙදර මාර්ගයේ උඩ පලාත බටගිර ගම් සභා සීමාවේ සිට ගලගෙදර දක්වා සහ එම මාර්ගයේ මැද සිට දෙපසට ඈතට ඈතුලත්කර ඇති දම්වැල් 10 ක දුර ප්‍රමාණය දම්වැල් 20 දක්වා වේ.

මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියලුම පුද්ගලයන් පිටපත් තුනකින් (3) සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1 යන ලිපිනයට වර්ෂ 1973 ඔක්තෝබර් මස 15 වනි දිනට මත්තෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාරදිය යුතුය.

ඉහත සඳහන් කරණු සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ දැන්වීමේ පලමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවි.

ජේ. ඇම්. යෝර්ක්,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින.

10-43—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

සැපයීමේ බලයලත් ප්‍රදේශය

පනතේ 9 වැනි ඡේදය හා
නි දින අංක 10,899 දරණ
යෝගයන් ප්‍රකාර මා වෙත
ඒ නගර සභාවට නිකුත් කර
දින දරන විදුලිබල පත්‍රයේ
බලය සැපයීමේ බලයලත්
රීම පිළිබඳව මවිසින් බලය
ඔක්තෝබර් මස 30 වැනි
ර්යාලයේ දි විභාගයක් පවත්
ඇනුම් දෙනු ලබේ.

ප්‍රසිද්ධ කළ අංක 14,851/1
හෙප්පුමුල්ල ප්‍රදේශය,

මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියලුම පුද්ගලයන් පිටපත් තුනකින් (3) සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1 යන ලිපිනයට 1973 ඔක්තෝබර් මස 24 වැනි දිනට මත්තෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාරදිය යුතුය.

ඉහත සඳහන් කරණු සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ දැන්වීමේ පලමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවි.

ජේ. ඇම්. යෝර්ක්,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

1973 සැප්තැම්බර් මස 21 වැනි දින.

10-44—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

(2) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ දැනගැනීම සඳහා කියවීම් ශාලාවේ අඩු වශයෙන් දින පහකට (5) වත් කලින් දැන්වීමක් මගින් ප්‍රචාරය කර 24(1) දරන ව්‍යවස්ථාවෙන් නියම කර ඇති කාල සීමාවන් වෙනස් කිරීමට සභාපතිතුමාට බලය තිබේ.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක්, සඟරාවක්, සිතියමක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසිම දේපොළක් කිසිවෙකු කියවීම් ශාලාවෙන් පිටතට ගෙන යා යුතු නැත.

26. බෝවෙන රෝගයකින් පෙළෙන කිසිම කෙනෙකු රෝග පැතිර යාමේ කාලසීමාව ඉක්මවා යනතුරු "මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට" ඇතුළු නොවිය යුතුය.

27. කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් නො හැසිරිය යුතුය.

(1) කියවීම් ශාලාව හා පුස්තකාලය වසාඇති වේලාවන්හිදී නිකරුණේ ඒ අසල නොහැසිරිය යුතුය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට ඇති ගම් සභාව සතු වූ ගොඩනැගිලිවලට හෝ වෙනත් දේපළවලට කිසිම අලාභ හානියක් නොකළ යුතුය.

(3) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම්බීම හා කෙළ ගැසීම නොකළ යුතුය.

(4) මහජන පුස්තකාලය තුළදී හෝ ඒ අසල කිසිවෙකු විසින් දාදුවලින් හෝ කඩදාසි වලින් සූදු කෙළීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රීඩාවක් කිරීම හෝ නොකළ යුතුය.

(5) පුස්තකාලය හා කියවීම් ශාලාව ඇතුළත හෝ ඒ අසල කෑ ගැසීම, සින්දු කීම් හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(6) අපිරිසිදුලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

(7) බල්ලන් හෝ බළලුන් හෝ වෙනත් කිසිම සතුන් පුස්තකාලයට හා කියවීම් ශාලා භූමියට නොගෙනා යුතුය.

(8) "මහජන පුස්තකාලය හා කියවීම් ශාලාව" තුළ හෝ ඒ අසල නිදාගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතුය.

(9) පුස්තකාල භාරකරු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීමට බලය පවරන ලද අයෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යානුකූලව ඉටුකරනු ලබන කටයුතු වලට කිසිවෙකු විසින් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" හෝ "සභාපතිතුමා" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල්පත්තු ගම්සභාවේ සභාපතිතුමා ද,

"ගම්සභාව" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල්පත්තු ගම් සභාව ද,

"ගම්සභා ප්‍රදේශය" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල් පත්තු ගම්සභා ප්‍රදේශය ද,

"පුස්තකාලය භාරකරු" යනුවෙන් අටකලන් කෝරළේ පන්නිල් පත්තු ගම්සභාව මගින් පත් කරන ලද පුස්තකාලයේ භාරකරු ද,

"සාමාජිකයෙකු" යනුවෙන් 4(1) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයෙකු හෝ 4(4) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජා මණ්ඩලයක් ද,

අදහස් කෙරේ.

පී. ඇන්. ජයසුන්දර,
අටකලන් කෝරළේ
පන්නිල්පත්තු ගම්සභාවේ සභාපති.

1973 සැප්තැම්බර් මස 17 වැනි දින,
පන්නිල්පත්තු ගම්සභා කාර්යාලය,
වැල්ලඳුර, කහවත්ත.

10-91—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## තුන්පනේ උඩපළාත නැගෙනහිර ගම් සභාවේ විදුලිය බලය සැපයීමේ බලයලත් ප්‍රදේශ දීර්ඝ කිරීම

වර්ෂ 1950 අංක 19 දරන විදුලිබල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වනි දින අංක 10,899 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව තුන්පනේ උඩපළාත නැගෙනහිර ගම් සභාවට නිකුත් කර ඇති වර්ෂ 1970 මාර්තු මස 24 වැනි දින දරන විදුලි බල පත්‍රයේ 'ඒ' උපලේඛණයෙහි සඳහන් විදුලි බලය සැපයීමේ බලයලත් ප්‍රදේශ පහත දැක්වෙන පරිදි දීර්ඝ කිරීම පිළිබඳව ම විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු වර්ෂ 1973 ඔක්තෝබර් මස 19 වෙනි දින පස්වරු 1.00 ට ගම් සභා කාර්යාලයේ දී විභාගයක් පවත්වනු ලබන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

දීර්ඝ කරනු ලබන ප්‍රදේශ :—

මඩිගේ-වල්පොල තැන්න මාර්ගයේ කොස්පොතු ඔය අසල සිට පවල්පාව සන්දිය දක්වා සහ එම මාර්ගයේ මැද සිට දම්වැල් 10 බැගින් දෙපසටද,

රඹුක්කන-ගලගෙදර මාර්ගයේ උඩ පළාත බටහිර ගම් සභා සීමාවේ සිට ගලගෙදර දක්වා සහ එම මාර්ගයේ මැද සිට දෙපසට ඈතට ඇතුලත්කර ඇති දම්වැල් 10 ක දුර ප්‍රමාණය දම්වැල් 20 දක්වා වේ.

මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියලුම පුද්ගලයන් පිටපත් තුනකින් (3) සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1 යන ලිපිනයට වර්ෂ 1973 ඔක්තෝබර් මස 15 වනි දිනට මත්තෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාරදිය යුතුය.

ඉහත සඳහන් කරණු සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ ඇන්වීමේ පලමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවී.

ජේ. ඇම්. යෝර්ක්,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

1973 සැප්තැම්බර් මස 18 වැනි දින.

10-43—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## වතුගෙදර සුළු නගර සභාවේ විදුලි බලය සැපයීමේ බලයලත් ප්‍රදේශය කෙටි කිරීම

වර්ෂ 1950 අංක 19 දරන විදුලි බල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වැනි දින අංක 10,899 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව වතුගෙදර සුළු නගර සභාවට නිකුත්කර ඇති වර්ෂ 1959 දෙසැම්බර් මස 2 වැනි දින දරන විදුලිබල පත්‍රයේ 'ඒ' උපලේඛණයෙහි සඳහන් විදුලි බලය සැපයීමේ බලයලත් ප්‍රදේශ පහත දැක්වෙන පරිදි කෙටි කිරීම පිළිබඳව මවිසින් බලය පවරනු ලබන නිලධාරියෙකු වර්ෂ 1973 ඔක්තෝබර් මස 30 වැනි දින පෙරවරු 11.00 ට සුළු නගර සභා කාර්යාලයේ දී විභාගයක් පවත්වනු ලබන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලබේ.

කෙටි කරනු ලබන ප්‍රදේශය :—

වර්ෂ 1969 අප්‍රේල් මස 25 වැනි දින ප්‍රසිද්ධ කළ අංක 14,851/1 දරණ ගැසට් පත්‍රයේ සඳහන් හෙප්පුමුල්ල ප්‍රදේශය,

මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියලුම පුද්ගලයන් පිටපත් තුනකින් (3) සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1 යන ලිපිනයට 1973 ඔක්තෝබර් මස 24 වැනි දිනට මත්තෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාරදිය යුතුය.

ඉහත සඳහන් කරණු සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ ඇන්වීමේ පලමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවි.

ජේ. ඇම්. යෝර්ක්,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

1973 සැප්තැම්බර් මස 21 වැනි දින.

10-44—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

**1.** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

**2.** පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

**3.** සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

**4.** සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5.** සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

**6.** ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7.** සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

**8.** වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

**9.** උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

**10.** 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11.** සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12.** **1966** මාර්තු **1** වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

**13.** **1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය — වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් .. | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් ... | 5.10.73 | සිකුරාද ... | 28. 9.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 12.10.73 | සිකුරාද ... | 5.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 19.10.73 | සිකුරාද ... | 12.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 26.10.73 | සිකුරාද ... | 19.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| නොවැම්බර් ... | 2.11.73 | සිකුරාද ... | 26.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 9.11.73 | සිකුරාද ... | 2.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 16.11.73 | සිකුරාද ... | 9.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 23.11.73 | සිකුරාද ... | 16.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 30.11.73 | සිකුරාද ... | 23.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් ... | 7.12.73 | සිකුරාද ... | 30.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 14.12.73 | සිකුරාද ... | 7.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 21.12.73 | සිකුරාද ... | 14.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | 28.12.73 | සිකුරාද ... | 21.12.73 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. ජී. පීරිස,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.